වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT
2019

වැය ශීර්ෂ අංකය : 052
செலவினத் தலைப்பின் இல.: 052
Expenditure Head No : 052

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය (කැබිනට් නොවන)
விஞ்ஞான, தொழினுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சு (அமைச்சரவை அந்தஸ்தற்ற)
Ministry of Science, Technology and Research (Non Cabinet)

අන්තර්ගතය

	පිටු අංකය
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/විධායක සාරාංශය	1
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	7
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	25
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක	38
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ..	39
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	40
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව …...	42

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

තරඟකාරී ගෝලීය ආර්ථිකය තුළ ජාතික සංවර්ධනයේදී විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රය උපාය මාර්ගිකව ඉතා වැදගත් ස්ථානයක් හිමි කර ගනී. තාක්ෂණය ඵලදායීව භාවිතා කිරීමකින් තොරව හා ශක්තිමත් ජාතික නවෝත්පාදන ධාරිතාවක් ළඟා කර නොගෙන තිරසර සංවර්ධන අභිමතාර්ථයන්හි සමාජයීය, ආර්ථික හා පාරිසරික අරමුණු සාක්ෂාත් කර ගැනීම දුෂ්කර කරුණක් බව මේ වන විට පැහැදිලි වී ඇත.

ඒ අනුව ලොව පුරා දියුණු කර්මාන්ත ආර්ථිකයන් තිරසර ආර්ථික වර්ධනය සහතික කෙරෙන උසස් තාක්ෂණයන් වෙත ක්‍රම ක්‍රමයෙන් නැඹුරු වෙමින් පවතී. එමෙන්ම තාක්ෂණික නවෝත්පාදනයන් රටක සංවර්ධනය සඳහා මෙන්ම නිෂ්පාදන හා සේවා යන දෙඅංශයෙහිම ලෝක වෙළඳපොල සමඟ තරඟ කිරීමට සුවිශාල දායකත්වයක් ලබා දේ. නව තාක්ෂණයන් හරහා අමුද්‍රව්‍ය මත පදනම් වූ අපනයනයන් සඳහා වටිනාකම් එක් කිරීම තුළින් ලෝක වෙළඳපොල සමඟ තරඟ කිරීමට අවස්ථාව උදා කර දී ඇත.

බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල්වල පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය සඳහා වෙන් කර ඇති ආයෝජන ප්‍රමාණය අඩු මට්ටමක පවතින අතර, ඒ සඳහා වැඩි දායකත්වයක් සපයනු ලබන්නේ රාජ්‍ය අංශයෙනි. උපරිම ලාභය මත ආයෝජන හසුරුවන බැවින් පෞද්ගලික අංශය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීමට මැලිකමක් දක්වන බැවින් ද පර්යේෂණ හා සංවර්ධන සඳහා රාජ්‍ය ආයෝජන අත්‍යාවශ්‍ය වේ.

මේ තත්ත්වය මැනවින් හඳුනා ගෙන ඇති මෙම අමාත්‍යාංශය ඒ වෙත රජය මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා විධිවිධාන යොදා තිබේ. ඒ අනුව නැඟී එන තාක්ෂණයන් වන ජෛව තාක්ෂණය, නැනෝ තාක්ෂණය, කෘත්‍රිම බුද්ධිය, රොබෝ තාක්ෂණය ආදී නවීන තාක්ෂණයන් වෙත අනුගත වී ඇති අතර එම තාක්ෂණයන් යොදා ගනිමින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර ඇත.

නැනෝ තාක්ෂණ මූලාරම්භයන්, ජාතික විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම, යාන්ත්‍ර විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI), පොහොර වර්ග වැඩිදියුණු කිරීම සඳහා පාංශු කළමනාකරණය සඳහා නිසරු බිම්හි සාරවත්භාවය ඉහළ නැංවීම, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදනය සඳහා දැව සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය කිරීම යන ව්‍යාපෘතීන් මේ යටතේ ක්‍රියාත්මක කර ඇත.

එමෙන්ම රටේ ආර්ථික වර්ධනය සඳහා නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදනවල වැදගත්කම පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය පුළුල් කිරීම සඳහා විද්‍යාව ප්‍රචලිත කිරීමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. විද්‍යාතා වැඩසටහන හරහා බිම් මට්ටමේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම සහ පර්යේෂණ නවෝත්පාදනයන් පවරා දීමට කටයුතු කර ඇත. මෙම කාර්යය සාක්ෂාත් කරනු පිණිස පර්යේෂණ සඳහා අරමුදල් සපයා දීම සහ සංවර්ධන ප්‍රමුඛතාවයන් අතර සබඳතා ස්ථාපනය කිරීම සඳහා ඉහළම ප්‍රමුඛතාව ලබාදීම සඳහා අමාත්‍යාංශය විසින් අඛණ්ඩව පියවර ගනු ලැබිණි.

2019 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත ලබා දී ඇති මුළු පුනරාවර්තන සහ ප්‍රාග්ධන අයවැය වෙන්කිරීම් පිළිවෙලින් රුපියල් මිලියන 1,864.82 ක් හා රුපියල් මිලියන 3,403.88 කි. මුළු වෙන්කිරීම් වලින් රුපියල් මිලියන 1,837.67ක් වූ පුනරාවර්තන වියදම් හා රුපියල් මිලියන 1,932.84 ක් වූ ප්‍රාග්ධන වියදම් 2019 වර්ෂය තුළ දී වැය කරන ලදී.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන හරහා 2030 දී සංවර්ධිත දේශයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.

මෙහෙවර

තිරසර සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ, අප සතු තරඟකාරී ආර්ථික ශක්‍යතාවන් කලාපීය වශයෙන් සවිමත් කර ගනු වස්, ඵලදායී විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පරිසර පද්ධතියක් (පර්යේෂණ හා සංවර්ධන, බුද්ධිමය දේපළ හිමිකම්, උසස් යටිතල ආදිය) ප්‍රවර්ධනය කෙරෙන සහ ඒ සඳහා ආධාර වන හිතකර පරිසරයක් (උචිත ප්‍රතිපත්ති, ක්‍රමෝපාය,වැඩසටහන්, ප්‍රමිති, අරමුදල් ආදිය) නිර්මාණය කිරීම.

ඉලක්ක හා අරමුණු

ඉලක්ක 1.	**ගෝලීය තරඟකාරී දර්ශකයෙහි සහ ගෝලීය නවෝත්පාදන දර්ශකයෙහි ඉහළ ස්ථානයක් අත්කරගැනීම.**
අරමුණ 1	ගෝලීය නවෝත්පාදක දර්ශකයේ 2018 වර්ෂයේ 88 වැනි ස්ථානයේ සිට 2024 වර්ෂය වනවිට 60 වැනි ස්ථානය කරා ළඟාවීම
අරමුණ 2	ගෝලීය තරඟකාරී දර්ශකයේ 2018 වර්ෂයේ 85 වැනි ස්ථානයේ සිට 2024 වනවිට 58 වැනි ස්ථානය කරා ළඟාවීම.
ඉලක්ක 2.	**වැඩිදියුණු කරනු ලැබූ අති නවීන විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන හිතකාමී පරිසරයක් සහ පර්යේෂණ ආයතන**
අරමුණ 1	පර්යේෂණ ආයතනයන්හි ප්‍රමුඛත්ව දර්ශකය 0.01 (2018) සිට 0.1 දක්වා, 2024 වර්ෂය වන විට ඉහළ නැංවීම
අරමුණ 2	පර්යේෂණ ආයතන වෙතින් ලබාගත් සේවාවන් 74 වැනි ස්ථානයේ සිට 54 වැනි ස්ථානය දක්වා 2024 වර්ෂය වනවිට ඉහළ නැංවීම.
අරමුණ 3	2015 වර්ෂයේදී 2215 ක් වූ පූර්ණ කාලීන පර්යේෂණ සේවක සංඛ්‍යාව 2024 වන විට 20%කින් ඉහළ නැංවීම
ඉලක්ක 3.	**විද්‍යාත්මක සාක්ෂරතාවයෙන් අනූන සමාජයක්**
අරමුණ 1	2018 වර්ෂයේදී 42516 ක් වූ STEM අධ්‍යාපනය සඳහා ඇතුළත් වූ උපාධිලාභීන් සංඛ්‍යාව 2024 වනවිට 20% කින් ඉහළ නැංවීම
අරමුණ 2	2015 දී 1968 ක් වූ උසස් උපාධීන් සහිත ස්ත්‍රී සේවක සංඛ්‍යාව 2024 වන විට 20%කින් ඉහළ නැංවීම
අරමුණ 3	විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් වාර්ෂිකව 15%කින් ඉහළ නැංවීම
ඉලක්ක 4.	**පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් පිළිබඳ සවිමත් සහ වැඩිදියුණු කරනු ලැබූ පාර්ශ්වකරුවන්ගේ සහයෝගීත්වයන්**
අරමුණ 1	2015 වර්ෂයේදී 0.106 ක් වූ පර්යේෂණ හා සංවර්ධන දළ වියදම (GERD) 2024 වනවිට 1ක් දක්වා ඉහළ නැංවීම.
අරමුණ 2	2015 වර්ෂයේදී 0.037 ක් වූ පර්යේෂණ සංවර්ධන ක්ෂේත්‍රයේ පෞද්ගලික අංශයේ ආයෝජනයන් 2025 වර්ෂය වනවිට 20%කින් ඉහළ නැංවීම.

අරමුණ 3	දළ ජාතික නිෂ්පාදිතයෙන්, පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය සඳහා යෙදවෙන රාජ්‍ය අරමුදල් 2024 වර්ෂය වනවිට 0.67% සිට 1% දක්වා ඉහළ නැංවීම.
අරමුණ 4	2018 වර්ෂයේදී 600ක් වූ පර්යේෂණ ආයතන / කර්මාන්ත පර්යේෂණ සහයෝගීතා ව්‍යාපෘති සංඛ්‍යාව, 2024 වන විට දෙගුණ කරගැනීම.
අරමුණ 5	2015 වර්ෂයේදී 0.002ක් වූ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ විදේශීය අරමුදල් යෙදවීම්, 2024 වර්ෂය වනවිට 20% කින් ඉහළ නැංවීම (විදේශ රටවල් විසින් මුදල් සපයන ලද පර්යේෂණ හා සංවර්ධන දළ වියදම).
අරමුණ 6	2024 වර්ෂය වනවිට, උසස් තාක්ෂණික නිෂ්පාදන අපනයනයන් ඇ: ඩො: මිලියන 59 සිට ඇ: ඩො: මිලියන 100 දක්වා ඉහළ නැංවීම.(සමස්ථ වෙළඳාමෙන් උසස් තාක්ෂණ අපනයන ප්‍රතිශතය)
අරමුණ 7	2015 වර්ෂයේදී 126ක් වූ නිෂ්පාදන සංඛ්‍යාව 2024 වර්ෂය වනවිට 20%කින් ඉහළ නැංවීම
ඉලක්ක 5.	**සවිමත් බුද්ධිමය දේපළ පරිසරයක් සහ ඉහළ මට්ටමේ දැනුම නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක්**
අරමුණ 1	2015 වර්ෂයේදී 38ක් වූ ලබාගත් දේශීය පේටන්ට් සංඛ්‍යාව 2024 වර්ෂය වනවිට 90 දක්වා ඉහළ නැංවීම.
අරමුණ 2	2018 වර්ෂයේදී 18ක් වූ ලබාගත් ජාත්‍යන්තර පේටන්ට් සංඛ්‍යාව, 2024 වර්ෂය වනවිට 20%කින් ඉහළ නැංවීම.
අරමුණ 3	2015 වර්ෂයේදී 396ක් වූ උපුටා දැක්විය හැකි ලේඛන H දර්ශකය 2024 වර්ෂන වනවිට 20%කින් ඉහළ නැංවීම.
අරමුණ 4	2024 වන විට, රාජ්‍ය අංශයේ (පර්යේෂණ හා සංවර්ධන) ආයතනවිසින් වැඩිදියුණු කරනු ලැබූ, පවරා දෙනු ලැබූ සහ වාණිජකරණය කරනු ලැබූ, නවෝත්පාදන සංඛ්‍යාව 20% කින් ඉහළ නැංවීම.
ඉලක්ක 6.	**ස්ථාවර තාක්ෂණ අවශෝෂණයන් ඉහළ නැංවීම / අපනයනයන් ඇතුළත් කර්මාන්ත සහ වෙළඳ අංශයේ තරඟකාරීත්වය ඉහළ නැංවීම**
අරමුණ 1	2018 වර්ෂයේදී 159ක් වූ කළමනාකරණ පද්ධති සහතික (ISO 9000)සංඛ්‍යාව, 2024 වනවිට 215 දක්වා ඉහළ නැංවීම
අරමුණ 2	2024 වන විට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පර්යේෂණ ආයතනයන්හි සියලු විද්‍යාගාරයන් ප්‍රතීතනය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

1. විද්‍යාව, තාක්ෂණ සහ පර්යේෂණ යන විෂයයන්ට අදාළව සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු , ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා යනාදිය යටතට ගැනෙන විෂයයන් හා අදාළව ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ ව්‍යාපෘතින් සම්පාදනය, ඒවා සුපරීක්ෂණය සහ ඇගැයීමට ලක්කිරීම.
2. ජාත්‍යන්තර වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයෙහි සිදුකරනු ලැබූ පර්යේෂණයන් ඇසුරෙන් ලත් නව සොයාගැනීම් සහ පර්යේෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.
3. දැනුම මත පදනම් වූ ආර්ථික සංවර්ධනයක් උදෙසා විද්‍යාව, තාක්ෂණ සහ නවෝත්පාදන වැඩිදියුණු කිරීම.
4. විද්‍යාත්මක, කාර්මික සහ සංවර්ධන ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා පියවර ගැනීම.
5. පර්යේෂණ සැලසුම් කිරීම සහ සිදුකිරීම සඳහා පර්යේෂණ සහ පර්යේෂණ ආයතන වෙත පහසුකම් සලසාදීම.
6. නිනිති සහ ජෛව තාක්ෂණය ඇතුළත්ව, නව පර්යේෂණ සහ සොයාගැනීම් පිළිබඳ තොරතුරු, ව්‍යාපාරික ප්‍රජාව ඇතුළත්ව අදාල පාර්ශ්වයන් වෙත ලබාදීම.
7. ප්‍රමිතීන් ස්ථාපනය සහ පරිපාලනය හා අදාළ ක්‍රියාකාරකම්
8. වෙනත් අමාත්‍යාංශ යටතේ පවත්නා පර්යේෂණ ආයතනයන් විසින් පවත්වනු ලබන පර්යේෂණ වැඩසටහන් සඳහා කාර්මික සහාය ලබාදීම.
9. නව සොයාගැනීම් සිදුකිරීම උදෙසා ප්‍රජාවන් වෙත මාර්ගෝපදේශකත්වය ලබාදීම සහ අභිප්‍රේරණය සඳහා පියවර ගැනීම.
10. විද්‍යාව, තාක්ෂණ සහ නවෝත්පාදනයන් ප්‍රජාව වෙත හඳුන්වාදීම හා ඒ හා අදාලව ව්‍යවසායකයින් බිහිකිරීම.
11. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලු පර්යේෂණ ආයතන අතර සම්බන්ධීකරණය හරහා ජාතික සංවර්ධන අභිමතාර්ථයන් ළඟාකරගැනීමට සක්‍රීයව දායක වීම.
12. ජාත්‍යන්තර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. විවිධ රටවල් සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහයෝගීතාවයන් ඇතිකර ගැනීම හරහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ වැඩසටහන් දියත් කිරීමෙන් ආර්ථික ප්‍රගතියක් අත්කර ගැනීම.
14. ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.
s
15. බුද්ධිමය දේපළ පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ පරිපාලන කටයුතු හා අදාළ කාර්යයන් හා ලෝක බුද්ධිමය දේපළ කාර්යාලයට අදාල කාර්යයන්
16. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් වෙත පැවරී ඇති වෙනත් සියලුම විෂයයන් හා අදාළ කරුණු
17. අමාත්‍යාංශය වෙත පැවරී ඇති ආයතනයන්හි සුපරීක්ෂණ කටයුතු

1.4. සංවිධාන සටහන

2.



1.5. අමාත්‍යාංශය යටතේ පවතින අංශ

අමාත්‍යාංශය පහතින් සඳහන් කර ඇති අංශ හයකින් සමන්විත වේ.

1. පාලන සහ මුදල් අංශය
2. තාක්ෂණ පැවරුම් අංශය (විදාතා වැඩසටහන)
3. තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන අංශය
4. සැලසුම් අංශය
5. අභ්‍යන්තර විගණන අංශය
6. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)

1.5.1 පාලන හා මුදල් අංශය

බලතල පවරාදීම යටතේ, කාර්යාල පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය සහ අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ වගකීම මෙම අංශය වෙත පැවරී ඇත.

1.5.2 තාක්ෂණ පැවරුම් අංශය (විදාතා වැඩසටහන)

විදාතා සම්පත් මධ්‍යස්ථාන 267 ක් හරහා, මහජනතාව සහ පාසැල් සිසුන් අතර විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා බිම්මට්ටමින් කටයුතු කරමින් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණය පවරාදීමේ වගකීම, මෙම අංශය වෙත පැවරි ඇත.

1.5.3 තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන අංශය

මෙම අංශය යටතේ ඒකක (Units) දෙකක් පවතී.

- **ජාත්‍යන්තර සබඳතා ඒකකය**

  විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සහයෝගීතාවයන් සඳහා පහසුකම් සලසාදීම මෙම ඒකකයේ වගකීම වේ.

- **විද්‍යා සහ පර්යේෂණ සංවර්ධන ඒකකය**

  මෙම ඒකකය වෙත පැවරී ඇති වගකීම වනුයේ, අරමුදල් සැපයීම, දැනුම නිර්මාණය, ධාරිතා ගොඩනැංවීම සහ තොරතුරු බෙදා හැරීම සඳහා තාක්ෂණ සංවර්ධන සහ නවෝත්පාදනයන් ආරම්භ කිරීම, ඒ සඳහා පහසුකම් සැපයීම සහ සහාය ලබාදීමයි.

1.5.4 සැලසුම් අංශය

අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි, සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සුපරීක්ෂණය, සමාලෝචනය සහ වාර්තා කිරීම සඳහා පහසුකම් සපයාදීමේ වගකීම මෙම අංශය වෙත පැවරී ඇත.

1.5.5 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ ක්‍රියාකාරීත්වය මනාව පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා දායක වීම මෙම අංශය වෙත පැවරී ඇති වගකීම වේ.

1.5.6 විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකා ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) ක්‍රමෝපාය හා අනුකූලව, අගයන් එක් කිරීම් සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම උදෙසා කටයුතු කිරීම මෙම අංශයෙහි වගකීම වේ.

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී .ක්ලාක් ආයතනය (ACCIMT)
2. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)
3. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)

4. ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)
5. ජාතික පර්යේෂණ සභාව (NRC)
6. ජාතික විද්‍යා පදනම (NSF)
7. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC)
8. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)
9. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)
10. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය (Planetarium)
11. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)
12. ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ පෞද් (සමාගම (SLINTEC)
13. ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO)

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අදාල නැත

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. තාක්ෂණ පැවරුම් අංශය (විදාතා වැඩසටහන)

ප්‍රගතිය

විදාතා යටතේ 2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම්

1. තාක්ෂණ පැවරුම් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන්
2. විද්‍යා හා තාක්ෂණ කුඩා පුස්තකාල පුළුල් කිරීම, විද්‍යා දින ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, ප්‍රභාෂ්වර බ්ලොග් පිටුව සහ වෙනත් මාධ්‍ය හා සම්බන්ධිත වැඩසටහන් විද්‍යා හා කුඩා තාක්ෂණ පුස්තකාල
3. තාක්ෂණ සායන වැඩසටහන්
4. විදාතා හරිත කඩමණ්ඩිය
5. පරීක්ෂණ වාර්තා සහ තත්ත්ව සහතික විදාතා පද්ධති සහතිකකරණ / GMP / SLS සඳහා මූල්‍යමය සහාය
6. විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපෘති
7. විදාතා කාර්යමණ්ඩලය සඳහා ධාරිතා වර්ධනය
8. වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම්

1. තාක්ෂණ පැවරුම් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන්

අනුක්‍රමික අංක	ක්ෂේත්‍රය	වැඩසටහන් සංඛ්‍යාව		ප්‍රතිලාභීන් සංඛ්‍යාව	
		තාක්ෂණ පැවරුම්	දැනුම්වත් කිරීම්	තාක්ෂණ පැවරුම්	දැනුම්වත් කිරීම්
1	ආහාර	805	459	118,419	85,182
2	නැගී එන තාක්ෂණයන්	381	288		
3	පරිගණක	558	268		
4	කෘෂිකර්මය	427	240		
5	පරිසර	203	246		
6	වෙනත්	654	472		
	එකතුව	**3,028**	**1,973**		

2. විද්‍යා හා තාක්ෂණ කුඩා පුස්තකාල පුළුල් කිරීම, විද්‍යා දින ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, ප්‍රභාෂ්වර බ්ලොග් පිටුව සහ වෙනත් මාධ්‍ය හා සම්බන්ධිත වැඩසටහන්

නවෝත්පාදක සංස්කෘතියක් හරහා තරුණ පරපුර පෝෂණය කිරීම සහ විද්‍යාත්මක සාහිත්‍යය වැඩිදියුණු කිරීමේ අරමුණින් සෑම දිස්ත්‍රික්කයකම විද්‍යා හා තාක්ෂණ කුඩා පුස්තකාල ස්ථාපනය කරනු ලැබිණි. විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ තරුණ පරපුර පෝෂණය කිරීමේ අරමුණින් ප්‍රභාෂ්වර බ්ලොග් පිටුව ආරම්භ කරන ලදී. මෙම බ්ලොග් පිටුවෙහි සුවිශේෂීත්වය වනුයේ සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය ත්‍රිත්වයෙන්ම කියවීමේ පහසුකම් පාඨකයන් සඳහා සලසා දී තිබීමයි. 2019 වර්ෂයේ තුළදී ලිපි 85ක් පළ කරනු ලැබිණි.

3. තාක්ෂණික සායන වැඩසටහන්

මඩකලපුව සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි තාක්ෂණ සායනික සත්කාරය පවත්වනු ලැබූ අතර කාර්මික තාක්ෂණ ආයතනය විසින් පවත්වනු ලැබූ බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන සහ මාළු ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ පසු විපරම් පුහුණු වැඩසටහන් දෙකක් 2019 වර්ෂයේදී පවත්වනු ලැබිණි .

4. විදාතා හරිත කඩමණ්ඩිය

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරනු ලැබූ "රට වෙනුවෙන් එකට සිටිමු" වැඩසටහන හා සමගාමීව මඩකලපුව, අම්පාර, මුලතිවු, මොණරාගල, ගම්පහ සහ යාපනය දිස්ත්‍රික්කයන්හි විදාතා හරිත කඩමණ්ඩිය පවත්වනු ලැබිණි. බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පවත්වනු ලැබූ "ශිල්ප සේනා" ප්‍රදර්ශනය හා සමගාමීව විදාතා හරිත කඩමණ්ඩිය ජාතික මට්ටමින් පවත්වනු ලැබිණි. 2019 වර්ෂයේදී එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා (Enterprise Sri Lanka) ප්‍රදර්ශනය හා සමගාමීව විදාතා හරිත කඩමණ්ඩිය අනුරාධපුරයේදී පැවැත්විණි. මෙයට අමතරව 2019 වර්ෂය තුළදී මන්නාරම, පොළොන්නරුව, මාතලේ, රත්නපුර සහ සෙත්සිරිපාය පරිශ්‍රය තුළදී විදාතා හරිත කඩමණ්ඩි ප්‍රදර්ශන 13ක් පවත්වනු ලැබිණි.

5. පරීක්ෂණ වාර්තා සහ තත්ත්ව සහතික විදාතා පද්ධති සහතිකකරණ / GMP / SLS සඳහා මූල්‍යමය සහාය

පරීක්ෂණ වාර්තා 54ක් නිකුත් කිරීම පිළිබඳ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින අතර වාර්තා 18ක් දැනටමත් නිකුත් කරනු ලැබ ඇත. 2019 වසරේදී විදාතා පද්ධති සහතික 45ක්, GMP සහතික 18ක් සහ එක් කාබනික සහතිකයක් නිකුත් කිරීම පිළිබඳ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

6. විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපෘති

තාක්ෂණය භාවිතයන් වැඩිදියුණු කිරීම සහ මහජනතාව හා සම්බන්ධ ප්‍රධාන ගැටලු සඳහා කඩිනමින් විසඳුම් සපයාදීම උදෙසා අමාත්‍යාංශය විසින් විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපෘතීන් සඳහා අරමුදල් යොදවා ඇත.

අංකය	දිස්ත්‍රික්කය	විදාතා සම්පත් මධ්‍යස්ථානය	ව්‍යාපෘති නාමය	වියදම (රුපියල්)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	අනුරාධපුර	රාජාංගනය	ජීව වායු ඒකක ආකෘතිය	70,065.58	10
2	රත්නපුර	රත්නපුර	දිරාපත් නොවන අපද්‍රව්‍ය (ප්ලාස්ටික් පොලිතීන්) අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරමින් දොර සහ ජනෙල් රාමු නිෂ්පාදනය	500,000.00	04
3	කුරුණෑගල	අලව්ව	බිම්මල් වගා ව්‍යාපෘතිය	137,500.00	10
4	මහනුවර	පන්විල	කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම	500,000.00	15
5	මන්නාරම	මුසලි	පිරිසිදු කිරීමේ දියර නිෂ්පාදන	270,000.00	06
6	යාපනය	වෙන්කනෙයි	බිම්මල් වගා ව්‍යාපෘතිය	500,000.00	15
7	මාතර	හක්මන	විසිතුරු මල්පැල වගාව	500,000.00	10

8	මාතර	කඹුරුපිටිය	බිම්මල් වගාව සඳහා පීඩන උඳුන් සපයා දීම	500,000.00	07
9	යාපනය	නල්ලූර්	පිරිසිදු කිරීමේ දියර නිෂ්පාදනය	500,000.00	20
10	මඩකලපුව	එරාවුර්පත්තු	මාළු නිෂ්පාදන සඳහා අගය එක් කිරීම	354,250.00	16
11	හම්බන්තොට	කටුවන	විදාතා නිෂ්පාදනයන්හි ඵලදායීතාව ඉහළ නැංවීම සහ තාක්ෂණික උපකරණ සපයාදීම	500,000.00	08
12	ගාල්ල	ඇල්පිටිය	හඳුන්කූරු නිෂ්පාදනය	160,000.00	03
13	අනුරාධපුර	ගලෙන්බිඳුනුවැව	කිරි ආශ්‍රිත නිෂ්පාදන	327,000.00	25
14	මාතර	පස්ගොඩ	දැල් ගෘහ තුළ උඩවැඩියා වගාව	454,500.00	10
15	අම්පාර	කල්මුණේ	යෝගට් නිෂ්පාදනය	412,200.00	10
16	පොළොන්නරුව	හිඟුරක්ගොඩ	සූර්ය බලශක්ති භාවිතයෙන් විෂ රහිත ආහාර නිෂ්පාදනය සඳහා ජල සැපයුම	480,000.00	500
17	අනුරාධපුර	නොච්චියාගම	විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පවත්වනු ලැබූ සබන් නිෂ්පාදන ව්‍යාපෘතිය	47,500.00	10
18	අනුරාධපුර	තලාව	සහල් පිටි ආශ්‍රිත කෙටි ආහාර නිෂ්පාදකයින් සඳහා තාක්ෂණ වැඩි දියුණු කිරීම	350,000.00	24
19	මොණරාගල	මැදගම	නැවත භාවිතා කළ හැකි ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය	500,000.00	කොට්ඨාස 35ක ජනතාව
20	පොළොන්නරුව	හිඟුරක්ගොඩ	සූර්ය බලශක්තිය යොදා ගනිමින් වගා සඳහා ජල සැපයුම	480,000.00	500
21	මාතර	මුලටියන	විසිතුරු මල් වගාව	475,000.00	25
22	හම්බන්තොට	අඟුණකොළපැලැස්ස	බිම්මල් වගාව සඳහා නව තාක්ෂණයන් හඳුන්වා දීම	356,000.00	20
23	මාතර	වැලිපිටිය	විසිතුරු මත්ස්‍ය වගාව පිළිබඳ ව්‍යාපෘතිය	428,185.00	10
24	ගාල්ල	බෝපේ පෝද්දල	බෑග් / පාවහන් නිෂ්පාදනයෙහි නියැලෙන ව්‍යවසායකයින් සඳහා යන්ත්‍ර සූත්‍ර සපයා දීම	224,000.00	16
25	මාතලේ	උකුවෙල	එළවළු විජලනය පිළිබඳ ව්‍යාපෘතිය	367,500.00	15
26	මාතර	තිහගොඩ	විසිතුරු මල් වගාකරුවන් සඳහා දැල් ගෘහ ස්ථාපනය කිරීම සහ පටක රෝපිත විද්‍යාගාර සඳහා උපකරණ සපයා දීම	500,000.00	16
27	මාතර	මාලිම්බඩ	බිම්මල් වගාව සඳහා ස්වයංක්‍රීය ජල සැපයුම් පද්ධතියක්	204,756.50	5
28	මන්නාරම	මන්නාරාම	පිරිසිදු පොල්තෙල් නිස්සාරණය කිරීමේ ව්‍යාපෘතිය	437,000.00	5
29	මඩකලපුව	මන්මුණේ බටහිර	පිරිසැකසුම් කරනු ලැබූ කජු පිළිබඳ ව්‍යාපෘතිය	253,690.00	14
30	කළුතර	දොඩංගොඩ	මදුරු විකර්ශක හඳුන්කූරු	500,000.00	11

31	රත්නපුර	කලවාන	බිම්මල් වගාව (ඔයිස්ටර් වර්ගයේ බිම්මල්)	410,940.00	34
32	කළුතර	දොඩංගොඩ	කුළුබඩු නිෂ්පාදනය	181,400.00	11
33	කුරුණෑගල	ඇහැටුවැව	සම් බෑග් නිෂ්පාදනය සඳහා යන්ත්‍ර සූත්‍ර සපයා දීම	457,191.00	9
34	මාතර	හක්මන	පාවහන් නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතිය	450,000.00	3
35	පොළොන්නරුව	හිඟුරක්ගොඩ	සූර්ය ශක්තිය භාවිතයෙන් හරිත සංකල්පය පදනම් කරගනිමින් පාසැල් සංවර්ධනය කිරීම	499,500.00	700
			එකතුව	13,288,178.08	

7. **විද්‍යාතා කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය**

අනුක්‍රමික අංකය	**පුහුණු වැඩසටහන**	**කාර්යමණ්ඩල කාණ්ඩය**	**පැවැත් වූ ස්ථානය**	**සහභාගී වූ සංඛ්‍යාව**
1	කාර්යාල රාජකාරි පිළිබඳ දැනුවත් කිරීම	කාර්යාල කාර්ය සහයක	කාර්මික තාක්ෂණ ආයතන ශ්‍රවණාගාරය	60
2	අමාත්‍යාංශයේ අනාගත සැලසුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	සියලුම විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල	අපේ ගම පරිශ්‍රය	850
3	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්ය භාර්ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසහන I / ii / iii / iv	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	250
4	ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්යභාර්ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - 1	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	හෙක්ටර් කොබ්බෑකඩුව පුහුණු මධ්‍යස්ථානය	55
5	ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්යභාර්ය සහ ශිල්පසේනා ප්‍රදර්ශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	250
6	යහපත් ආකල්ප සංවර්ධනය පිළිබඳ වැඩමුළුව (i)	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	ජාතික විද්‍යා පදනම	60
7	යහපත් ආකල්ප සංවර්ධනය පිළිබඳ වැඩමුළුව (ii)	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	වයඹ පුහුණු මධ්‍යස්ථානය	50
8	යහපත් ආකල්ප සංවර්ධනය පිළිබඳ වැඩමුළුව (iii)	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානය	40
9	යහපත් ආකල්ප සංවර්ධනය පිළිබඳ වැඩමුළුව (iv)	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	දික්වැල්ල පුහුණු මධ්‍යස්ථානය	50
10	යහපත් ආකල්ප සංවර්ධනය පිළිබඳ වැඩමුළුව (v)	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය	50
11	GMP / SLS විගණන පටිපාටිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	78
12	ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්යභාර්ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව - 2	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය, මාතර	45

8. **වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම්**

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරනු ලැබූ වසවිස නැති ගොවිතැන පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සඳහා අමාත්‍යාංශයේ දායකත්වයක් හිමි වේ. වස විස නැති ගොවිතැන පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ මෙහෙයුම් කමිටුවේ රැස්වීම් 2ක්, 2019 ඔක්තෝම්බර් 18 සහ 31 දිනයන්හිදී පවත්වනු ලැබූ අතර 2018 වර්ෂයේදී පවත්වනු ලැබූ ව්‍යාපෘතීන්හි මූල්‍යමය හා භෞතික ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කරනු ලැබිණි.

- ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ තිරසර අස්වන නෙළීමේ පද්ධතියක් සඳහා පර්යේෂණ වේදිකාවක් වැඩිදියුණු කිරීමේ බහුවිෂයානුබද්ධ ප්‍රවේශයක්, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලදී.
- ශ්‍රී ලංකාවේ තෝරාගත් දේශීය අල වර්ගයන්හි පෝෂණීය, පෝෂණීය නොවන සහ ක්‍රියාකාරී ගුණාංග පිළිබඳ විමර්ශනයක්, ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය විසින් පවත්වන ලදී.

2.2 තාක්ෂණ හා පර්යේෂණ සංවර්ධන අංශය

2.2.1 විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන

2.2.1.1 පර්යේෂණ හා සංවර්ධන පිළිබඳ ආයෝජන (ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව - NRDF ක්‍රියාත්මක කිරීම)

- පර්යේෂණ හා සංවර්ධන රාමුව විසින් හඳුනාගනු ලැබ ඇති මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසා දෙනු පිණිස, අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ එක්ව පර්යේෂණ සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී.

I. ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය 2019, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සමඟ සංවිධානය කරන ලදී. 2019 පෙබරවාරි 7 – 9 දින දක්වා බදුල්ලේදී පවත්වනු ලැබූ මෙම වැඩසටහන, "තාක්ෂණය සහ නවෝත්පාදනය හරහා තිරසර ව්‍යාපාර බවට පරිවර්තනය" යන තේමාව යටතේ පවත්වන ලදී.

II. රජරට ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය - 2019, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සමඟ සංවිධානය කරන ලදී.

III. "සුහුරු පරිගණක සහ පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය" කැළණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සමඟ සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලැබිණි. මෙම සම්න්ත්‍රණයේ මූලික අරමුණ වූයේ සුහුරු පරිගණක සහ පද්ධති ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ සිය පර්යේෂණයන් ඉදිරිපත් කිරීමට විද්වතුන්ට, පර්යේෂකයින්ට සහ කර්මාන්ත අංශයේ විශේෂඥයින්ට වේදිකාවක් නිර්මාණය කර දීම.

IV. "නවෝත්පාදන හා නව නිපැයුම් ප්‍රදර්ශනය" ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟ සම සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන අප්‍රේල් 2 සහ 3 දිනයන්හිදී බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.

V. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ තරුණ විද්‍යාඥ බහුවිෂයානුබද්ධ සම්මන්ත්‍රණය - 2019 ජාතික මූලික අධ්‍යයන ආයතනය සමඟ සම සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන 2019 අප්‍රේල් 22 දින මහනුවරදී පවත්වන ලදී.

VI. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සහයෝගීතාවයෙන් ශිෂ්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කරනු ලැබිණි. මෙම වැඩසටහන 2019 දෙසැම්බර් 5 – 6 දිනයන්හිදී පැවැත්විණි.

VII. පශ්චාත් උපාධි විද්‍යා ආයතනයේ පර්යේෂණ කොංග්‍රසය 2019 (PGIS RESCON – 2019) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි විද්‍යා ආයතනය සමඟ සම සංවිධානය කෙරිණි.

2.2.1.2 ජාතික විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම

භූමිය අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර ඇත.

2.2.1.3 ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත (STEM) අධ්‍යාපන සංවර්ධනය

- **2019** දෙසැම්බර් **26** දින ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයට දර්ශනය වන වලයාකාර සූර්යග්‍රහණය සිදුවන කාලසීමාව තුළදී සමාජ සත්කාරක සහ පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා වැඩමුළුවක් යාපනය විශ්වවිද්‍යාලය සමඟ සම සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සමඟ සහයෝගීතාවයෙන්, පාසැල් STEM සමාජ සහ ඒ හා සම්බන්ධිත ක්‍රියාකාරකම් දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා "STEM අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සහ සංවර්ධනය" යන තේමාව යටතේ වැඩමුළු පවත්වනු ලැබිණි.

2.2.1.4 විද්‍යාව ප්‍රචලිත කිරීම

- **"විද්‍යා" මාසික පුවත්පත් අතිරේකය**

පාසැල් සිසුන් සහ මහජනතාව වෙත විද්‍යාත්මක දැනුම බෙදාදීමේ අරමුණින් දිනමිණ, තිනකරන් සහ ඩේලි නිවුස් යන පුවත්පත් සමඟ භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කරනු ලැබූ "විද්‍යා" පුවත්පත් අතිරේකය (පිටු 12) මාසිකව නිකුත් කෙරෙන අතර -e පුවත්පතක් ලෙසද ප්‍රකාශයට පත් කෙරිණි.

පාසැල් සිසුන් STEM අධ්‍යාපනය වෙත ප්‍රවේශ වීම සඳහා ඔවුන් අභිප්‍රේරණය කරනු පිණිස විද්‍යා පුවත්පත් අතිරේකය හරහා විශේෂ අවධානය යොමු වී ඇත. පාඨකයින් සඳහා සකසනු ලැබූ ප්‍රශ්නාවලියක් පුවත්පත් අතිරේකය සඳහා ඇතුළත් කරනු ලැබ ඇති අතර ව්‍යුහගත ඇඟයීමේ ක්‍රියාවලියක් හරහා ජයග්‍රහකයින් තෝරා ත්‍යාග පිරිනමනු ලැබේ.

- **ප්‍රදර්ශන**

– බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති "වසවිස නැති රටක්" ප්‍රදර්ශනය සඳහා දායකත්වය දක්වන ලදී.
– V2025 – Enterprise Sri Lanka සංවිධානය කිරීම සඳහා දායකත්වය දක්වන ලදී.

- **විද්‍යා චිත්‍රපට උළෙල**

පාසැල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් සහ මහජනතාව වෙත විද්‍යා චිත්‍රපටි හරහා දැනුම බෙදා දීම සඳහා ගෝතේ ආයතනය සමඟ විද්‍යා චිත්‍රපටි උළෙල 2019 පවත්වන ලදී.

විද්‍යාත්මක විනෝදාස්වාදය සහ අත්දැකීම් ජාත්‍යන්තර විද්‍යාත්මක ප්‍රජාව සමඟ බෙදාහදා ගැනීම සඳහා ශ්‍රී ලාංකිකයින්ට මේ හරහා අවස්ථාව උදා වූ අතර ශ්‍රී ලාංකීය සමාජයේ විවිධ ඉලක්ක ගත කණ්ඩායම් (ප්‍රාථමික පාසල්, ද්විතියික පාසල්, මහජනතාව) අතර විද්‍යා ,තාක්ෂණ හා නවෝත්පාදන සංස්කෘතියක් පිළිබඳ දැනුම් නිර්මාණයක්ද සිදුවිය.

2.2.1.5 පර්යේෂණ සඳහා පහසුකම් සලසාදීම

කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2014 හා අනුකූලව පර්යේෂණ දීමනා ගෙවීම් කිරීම සඳහා ඇගැයීම් කටයුතු සිදු කෙරේ.

2.2.1.6 ද්විපාර්ශ්වික සහයෝගීතාවය

- **ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන**

2011 සැප්තැම්බර් මසදී මෙම අමාත්‍යාංශය විසින් ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතා වැඩසටහනක් (PoC) ආරම්භ කරනු ලැබූ අතර ඒ යටතේ දෙරටෙහිම විද්‍යාඥයින් හට ඒකාබද්ධ සහයෝගීතා පර්යේෂණයන්හි නියැලීම සහ වැඩමුළු පැවැත්වීම සඳහා ප්‍රතිපාදන සපයා දෙන ලදී. මෙම සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති 17ක් තෝරාගනු

ලැබිණි. 2019 අගෝස්තු 8 සහ 9යන දිනයන්හිදී මධ්‍යකාලීන ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වන ලදී. සමාලෝචිත කාල සීමාව තුළදී ක්‍රියාත්මක කරනු පිණිස පහත පර්යේෂණ ව්‍යාපෘතීන් 17ක් තෝරාගනු ලැබිණි.

- අභ්‍යාවකාශ යෙදවුම් සඳහා සුළං පිරවූ ව්‍යුහයන්හි ගතික විශ්ලේෂණය සහ හැඩය පාලනය.
- තාපමය නොවන ක්‍රියාවලි භාවිතයෙන් කුළුබඩුවල මතුපිට ජීවාණුහරණයන් පිළිබඳ අධ්‍යනය.
- තේවල වැදගත් ශිෂ්‍ය විද්‍යාත්මක ගති ලක්ෂණ විදහා පෙන්වීම සහ විච්ඡේදනය ශීඝ්‍ර කරවීම සඳහා උසස් ප්‍රවේණි දර්ශ යොදාගැනීම.
- ආහාර, ජෛව ක්‍රියාකාරී සහ පෝෂණීය ආහාර අතිරේක සුරක්ෂිතව රැගෙන යාම සඳහා ජෛව බහුඅවයවික /ජෛව පෘෂ්ඨීය සක්‍රියකාරක පදනම් වූ ක්ෂුද්‍ර /නැනෝ වාහන.
- ප්‍රකාශ වෝල්ටීය, ක්ෂුද්‍ර ජාලක පද්ධතිය සඳහා ප්‍රතිරූපක ආකෘතිය.
- ජාලක හා සබැඳි යෙදවුම් සඳහා බහු මට්ටම් අපවර්තකයක් යොදාගනිමින් දෙමුහුන් සුළං -සූර්ය බල විදුලි උත්පාදන පද්ධතියක් නිර්මාණය සහ සංවර්ධනය කිරීම.
- තිරසර නිෂ්පාදනය සඳහා ඉහළ උෂ්ණත්වයන් යටතේ ස්වයංචලිත ද්‍රව්‍ය නිර්මාණය සහ ලිහිසි ද්‍රව්‍ය තෝරා ගැනීම.
- ද්විමාන දෙමුහුන් කාබනික සහ අකාබනික Perovskites හි ඉලෙක්ට්‍රෝනික සහ ප්‍රකාශවෝල්ටීය.
- ශ්‍රී ලංකාවේ මීගමු කලපු සහ ඉන්දියාවේ ගුජරාට් ප්‍රදේශයේ කම්බට් බොක්ක සහ කුච් බොක්ක ආශ්‍රිතව කඩොලාන ශාක වෙතින් ලබාගත් අන්ත:ලයිකන දිලීරයන්හි ජෛව පූර්වේක්ෂණය; විශේෂ ව්‍යුහයන් සහ ජෛව ක්‍රියාකාරී සංයෝගයන් අනාවරණය සඳහා මෙතෙක් ගවේෂණය නොකළ සම්පත් සමූහයකි.
- Mangifera Indica (ඉන්දියා) සහ Mangifera Zeylanica හි (ශ්‍රී ලංකා) පිළිකා ප්‍රතිරෝධී සහ radio priming බලපෑම් පිළිබඳ සහ හරිත නිනිති සංයෝගයන්හි බලපෑම් පිළිබඳ නාලස්ථ සහ ජීවස්ථ අපිජනක විමර්ශනයන්.
- සිවිල් ව්‍යුහයන්හි ව්‍යුහාත්මක සෞඛ්‍ය සූපරීක්ෂණය සඳහා ජාලාකරණ බෙදාහැරීම් අනාවරක යාන්ත්‍රණයක් ආශ්‍රිත රැහැන් රහිත සංවේදක.
- දකුණු ඉන්දියාවේ සහ නිරිතදිග ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශයන්හි ඛනිජ නිධි සම්භවය සහ ඒවායේ විසිරි පැවතීම පිළිබඳ ගවේෂණය.
- ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්කමක් උසුලන රටෙහි උරුමයන් ලෙස සැලකෙන ස්මාරක සහ බිම් සලකුණු ඍජු අකුණු හේතුවෙන් ඇතිවන හානිවලින් ආරක්ෂා කිරීම -සාම්ප්‍රදායික සහ විද්‍යාත්මක ක්‍රමවේදයන්.
- ගොඩ කරනු ලැබූ බිම් ඇසුරින් වායු පිටවීම විදහා දැක්වීම : ප්‍රායෝගික සහ සංඛ්‍යාත්මක විමර්ශන (CLEAN)
- ඉන්දියානු උපමහද්වීපික පැළෑටි ඇසුරින් පුනර්ජනනීය රසායන ද්‍රව්‍ය වෙන්කර ගරනීම ,ස්වයං ඒකරාශී වීම සහ ඖෂධ ලබාදීම, වෛද්‍ය ක්‍රම සහ උත්ප්‍රේරණයන්හි භාවිතය.
- ක්ෂුද්‍ර ඇල්ගී ආශ්‍රිත ජෛව ඉන්ධන සහ අගයන් එක් කළ නිෂ්පාදනයන්හි ක්‍රියාවලි සංවර්ධනය සහ තක්සේරු / ඇගයීම.
- සංවේදක ජාලයන්, ගුවන් ගත කළ සහ භූමියේ ස්ථාපිත කළ රොබෝ උපකරණ යොදාගනිමින්, ලැව්ගිනි අනාවරණය කර ගැනීමේ පද්ධතීන් සැලසුම් නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීම.

ඉහත සඳහන් කරනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘතීන්හි මධ්‍ය වාර ප්‍රගති සමාලෝචන රැස්වීම, 2019 අගෝස්තු 8 සහ 9 දිනයන්හිදී පවත්වනු ලැබිණි.

- **විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ඉන්දු -ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුව**

විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ඉන්දු -ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවෙහි සිව්වන හමුව ,ඉන්දියාවේ නවදිල්ලි නුවරදී ශ්‍රී ලංකා රජයේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව අතර, 2019 අගෝස්තු 14 දින පවත්වනු ලැබිණි. මෙම රැස්වීම අතරතුරේදී, නව සහයෝගීතා වැඩසටහනක් පිළිබඳ සාකච්ඡා පවත්වනු ලැබ ඒ පිළිබඳ අවසන් නිගමනයට එළැඹී ඇත. මෙම නව සහයෝගීතා වැඩසටහන යටතේ නව සහයෝගීතා ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධයෙන් කටයුතු කෙරෙනු ඇති අතර මෙම සහයෝගීතා වැඩසටහන ක්‍රියාත්මක කරනු පිණිස සක්‍රීයව සහභාගීත්වය දැක්වීමට දෙපාර්ශවයේම එකඟත්වය පළවිණි, මෙලෙස එකඟතාවය පළමු ක්ෂේත්‍ර පහත පරිදි වේ.

- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
- පුනර්ජනනීය බලශක්තිය
- ආහාර තාක්ෂණය සඳහා අගයන් එක් කිරීම
- කසළ කළමනාකරණය (ඝන, හරිත, ඉලෙක්ට්‍රොනික)

2019 වර්ෂයේදී පර්යේෂණ යෝජනා කැඳවීමටත් තෝරා ගැනීමෙන් අනතුරුව 2020 වර්ෂයේ සිට ඒ සඳහා අරමුදල් සපයා දීමටත් එකඟත්වය පළවිණි. සහයෝගීතා වැඩසටහන යටතේ, දෙරට විසින්ම ඒකාබද්ධ යෝජනා කැඳවීමක් සිදු කරන ලදි. 2019 නොවැම්බර් 30 දක්වා ඇගැයීම් කරනු පිණිස, පර්යේෂණ යෝජනා 190ක් සහ වැඩමුළු සඳහා යෝජනා 22ක් ලැබී ඇත.

- **යුරෝපා න්‍යෂ්ටික සංවිධානයෙහි අධිශක්ති භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි (CERN)**

යුරෝපා න්‍යෂ්ටික සංවිධානයෙහි (CERN) අධිශක්ති භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි දක්වා පශ්චාත් උපාධි අධ්‍යයන යුරෝපා න්‍යෂ්ටික සංවිධානය (CERN) විසින් ශ්‍රී ලාංකීය තරුණ විද්‍යාඥයින් සහ පර්යේෂකයින් සඳහා අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ අරමුණින්, අධිශක්ති භෞතික විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ ආචාර්ය උපාධි වැඩසටහන් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන යටතේ ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සිදුකිරීම සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍යයින් සිව්දෙනා මෙම වසරේදී ද CERN හි සිය ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතුවල නිරතව සිටිති.

අනාවරණ තාක්ෂණ සහ යෙදවුම් පිළිබඳ දෙවැනි දකුණු ආසියානු අධිශක්ති භෞතික විද්‍යා උපකාරක (SAHEPI – 2) වැඩමුළු 2019පෙබරවාරි 20 සහ 21 යන දිනයන්හිදී ශ්‍රී ලංකාවේ කොළඹ දී සාර්ථකව පැවැත්විණි.

- **ශ්‍රී ලංකාව තුළ ක්‍රිසොටයිල් ඇස්බැස්ටෝස්හි භාවිතය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම.**

අමාත්‍යාංශය සහ රුසියාවේ යුරල් වාණිජ මණ්ඩලය අතර ඇති කරගනු ලැබූ සහයෝගීතාවන්හි ප්‍රතිඵලයක් ලෙස, රුසියානු හා ශ්‍රී ලාංකීය නියෝජිතයින්ගෙන් සැදුම්ලත් ක්‍රියාකාරී කණ්ඩායමක් පත්කරනු ලැබිණි. මෙම ක්‍රියාකාරී කණ්ඩායමෙහි ඉල්ලීම මත, කර්මාන්තයන්හි හා ඉදිකිරීම් වැඩබිම්හි මෙන්ම අවසන් පාරිභෝගික මට්ටම් දක්වා ඇස්බැස්ටස් භාවිතයෙහි හිතකර සහ අහිතකර තත්ත්වයන් පිළිබඳ පර්යේෂණ කණ්ඩායම් 4ක් විසින් සොයා බලනු ලැබේ. මෙම පර්යේෂණයන්හි සොයාගැනීම් තුළින්, මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යාත්මක දැනුමේ අභිවර්ධනය සඳහා දායකත්වය අපේක්ෂා කෙරෙන අතර විශේෂයෙන්ම මෙම සොයාගැනීම් වලංගුභාවයට පත්කිරීම හරහා, අනාගතයේදී ජාතික ප්‍රතිපත්තිමය තීරණ සඳහා එම සොයාගැනීම් භාවිතා කිරීමද අපේක්ෂිතය. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රුසියානු සමූහාණ්ඩුව සමග සම පදනමක් යටතේ වියදම් දරනු ලැබේ. පර්යේෂණ ව්‍යාපෘතියේ දෙවන වාරිකය සඳහා වියදම් දරනු ලැබුවේ රුසියානු සමූහාණ්ඩුව විසිනි .ශ්‍රී ලංකාව තුළ ක්‍රිසොටයිල් ඇස්බැස්ටෝස්හි ආරක්ෂිත භාවිතය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ 6 වන හමුව තායිලන්තයේ බැංකොක් නුවරදී 2019 ජූලි 09 සහ 10 යන දිනයන්හිදී පැවැත්වුණු අතර එහිදී පර්යේෂණයන්හි ප්‍රගතිය සාකච්ඡාවට ලක් කෙරිණි.

ශ්‍රී ලංකාවේ පරිසරය තුළ ක්‍රිසොටයිල් ඇස්බැස්ටෝස් තන්තු සහ එහි සෞඛ්‍යමය වැදගත්කම පිළිබඳ සම්මන්ත්‍රණය, 2019 මාර්තු 27 දින ශ්‍රී ලංකාවේ කොළඹ දී පැවැත්විණි.

- **අත්සන් තබනු ලැබූ සහ ආරම්භ කරනු ලැබූ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්**

ශ්‍රී ලංකාව සහ නේපාලය අතර විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදව ක්ෂේත්‍රයෙහි සහයෝගීතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිණි. නේපාල පාර්ශවයෙන් සුදුසු දිනයක් සඳහා ඉල්ලීම් කර ඇත.

- **විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති සමාලෝචනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධනය සඳහා වූ විද්‍යා හා තාක්ෂණ කොමිසම (UNCSTD) වෙත චාරිකාවක නියැළීම**

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශ ලේකම් ප්‍රධාන අමාත්‍යාංශ නියෝජිත මණ්ඩලයක් විසින් CERNහි අධිශක්ති භෞතික විද්‍යාව පිළිබඳ යුරෝපා සංවිධානය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත, 2019 ජූනි 14 සහ 18 දක්වා චාරිකාවක් නියැළිණි. මෙම චාරිකාවේ මූලික අරමුණ වූයේ CERN හි දැනටමත් සිය ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතුවල නියුතු ශිෂ්‍යයින්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති සමාලෝචනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවර්ධනය සඳහා වූ විද්‍යා හා තාක්ෂණ කොමිසම (UNCSTD) සමඟ සාකච්ඡා පැවැත්වීමයි. ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතුවල නිරත ශි ශිෂ්‍යයින්ගේ ප්‍රගතිය සතුටුදායක වූ අතර තොරතුරු තාක්ෂණ සහ දත්ත කළමනාකරණ කර්යයන්හි භාවිත කරනු පිණිස දෘඪාංග පරිත්‍යාගයක් CERN වෙතින් ලබාගැනීමට මෙම නියෝජිත මණ්ඩලයට හැකියාව උදාවිණි. කෙසේ වුවද UNCSTD සමඟ සිදු කරනු ලැබූ සාකච්ඡාවන් සාර්ථක නොවූ අතර එසේ වීමට හේතු වූයේ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සමාලෝචනය සඳහා අරමුදල් යෙදවීමට UNCSTD සතුව ප්‍රතිපාදන නොවූ බැවිනි. ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් යොදවන්නේ නම්, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති සමාලෝචනය පිළිබඳ ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන පැවැත්වීම සඳහා සිය කැමැත්ත UNCSTD විසින් ප්‍රකාශ කරන ලදී.

2.2.1.7 වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම්

- **"ශිල්ප සේනා" ප්‍රදර්ශනය**

ශිල්ප සේනා ප්‍රදර්ශනය සාර්ථකව සංවිධානය කරනු ලැබ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී හා පොළොන්නරුවේදී පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනයේ තේමාව වූයේ " ශ්‍රී ලංකා තාක්ෂණ විප්ලවය" යන්නයි.මෙම ප්‍රදර්ශනය කලාප 4කින් සමන්විත වූ අතර සමාජය උදෙසා තේමාගත තාක්ෂණයන් 12ක්, රැකියාපොළ ව්‍යවසායකත්වය සහ නවෝත්පාදන සහ අධ්‍යාපනික විනෝදාස්වාදය යන කලාප යටතේ එය පැවැත්විනි. තාක්ෂණික කලාපය STEM අධ්‍යාපනය, රොබෝ තාක්ෂණය සහ කාර්මික ස්වයංක්‍රීයකරණය, කෘත්‍රිම බුද්ධිය (AI), ජෛව තාක්ෂණය, නිනිති තාක්ෂණය, ස්නායුක තාක්ෂණය, නීල හරිත තාන්ෂණය, නව්‍ය බලශක්ති, 5G, IOT, අභ්‍යවකාශ තාක්ෂණය, පුද්ගල කේන්ද්‍රිය වෛද්‍ය ක්‍රම සහ යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යා යන ප්‍රධාන තාක්ෂණික තේමා 12ක් යටතේ පවත්වන ලදී.

- **සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන ව්‍යාපෘතිය**

සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන ව්‍යාපෘතිය; කැළණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ යාපනය විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය යන සිව් විශ්වවිද්‍යාලයන් සහ ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) යටතේ ක්‍රියාත්මක කෙරෙන අතර පහත සඳහන් අරමුණු ඒ හරහා සපුරා ගැනීම අපේක්ෂිතය. (අ) අ.පො.ස. සා / පෙළ හා උ / පෙළ පාසල් ශිෂ්‍යයින් හට සූර්ය බලශක්ති භාවිතයේ වැදගත්කම පිළිබඳ දැනුම ප්‍රායෝගික අත්හදාබැලීම් හරහා ලබාදීම, (ආ) සූර්ය පැනල සවි කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ 2000ක පමණ තරුණ පිරිසකගෙන් සමන්විත නිපුණතා සහිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සහ (ඇ) තුනී පටල සූර්ය කෝෂ / පැනල මූලාකෘති නිෂ්පාදනය පිළිබඳ අදාළ

විශ්ව විද්‍යාලයන්හි පර්යේෂණ හා සංවර්ධන (R & D) පහසුකම් වැඩි දියුණු කිරීම. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කැළණිය විශ්ව විද්‍යාලයේ ස්ථාපනය කරනු ලැබ ඇති අතර අමාත්‍යාංශය, මෙන්ම ව්‍යාපෘති අධ්‍යක්ෂක සහ විශ්ව විද්‍යාල තුනෙහි සහ ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සිව්දෙනාගේ මාර්ගෝපදේශකත්වය යටතේ ක්‍රියාත්මක වේ.

- **යාන්ත්‍රි විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI)**

යාන්ත්‍රි විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI) යනු 2016 අයවැය යෝජනාවෙන් අනුමත වූ ව්‍යාපෘතියක් වන අතර ඒ හා සම්බන්ධ මූලික කාර්යයන් 2017 වර්ෂයේදී ආරම්භ කරනු ලැබිණි. මෙම මූලාරම්භයේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය සහ ගෝලීය වශයෙන් බලපත්‍රලාභී නිෂ්පාදකයින් සඳහා සුහුරු යන්ත්‍ර සැලසුම් නිර්මාණය හරහා අපගේ ආර්ථිකය සහ අධිතාක්ෂණික අපනයනයන් වර්ධනය කරවීමත් ආනයනයන් පහත හෙළීමත්ය. මෙම මූලාරම්භයන් හරහා, ගෝලීය මට්ටමේ ප්‍රමිතීන් සහිතව දේශීයව සහ ගෝලීය මට්ටමින් සිය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා නිෂ්පාදන සැලසුම් නිර්මාණ ඉංජිනේරු (PDE) සමාගම් සඳහා පහසුකම් සපයාදීම අරමුණු කෙරේ. මෙම මූලාරම්භයෙහි ප්‍රථම අදියර යටතේ යාන්ත්‍රි ඉලෙක්ට්‍රෝනික විද්‍යාව පිළිබඳ අවධානය යොමු කෙරෙනු ඇති අතර අනාගතයේදී වෙනත් ක්ෂේත්‍රයන්ද ආවරණය කෙරෙන පරිදි පුළුල් කෙරෙනු ඇත. මෙම මූලාරම්භය ප්‍රධාන සංරචක දෙකකින් සමන්විතය. ඒවා නම්, දීර්ඝ කාලීන ණය පහසුකම (LTLF) සහ ප්‍රමිති පුහුණු, මූලාකෘතිකරණ සහ පරීක්ෂණ පහසුකම (SPTF) වේ. LTLF සංරචකය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය දැනටමත් ලැබී ඇති අතර, එය මුදල් අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් "Enterprise Sri Lanka" යටතේ ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙහි SPTF සංරචකය, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලත්වය දක්වනු පිණිස ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) විසින් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

මෙහි ක්‍රියාකාරකම්හි සාරාංශයක් පහතින් දක්වා ඇත .

- විශේෂ ණය යෝජනා ක්‍රමයක් යටතේ දීර්ඝ කාලීන ණය පහසුකම් (LTLF) ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී ඇත.
- ප්‍රමිති පුහුණු මූලාකෘතිකරණ පරීක්ෂා පහසුකම පිළිබඳ සවිස්තරාත්මක යෝජනාව සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.
- හෝමාගම, පිටිපන නිනිති තාක්ෂණ හා විද්‍යා උද්‍යානයෙන් අවශ්‍ය කාර්යාල පහසුකම් දැනටමත් ලබාදී ඇත.
- විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා පස් අවුරුදු ක්‍රියාකාරී සැලැසුමක් ඉදිරිපත් කරනු ලැබ ඇත.
- ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබ ඇත. ව්‍යාපෘති කාර්යමණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ඉල්ලා ඇති අතර NERDC මධ්‍යස්ථානය වෙතින් බඳවා ගැනීම් සිදු කරන ලෙසට උපදෙස් ලැබී ඇත. 2019 සැප්තැම්බර් මසදී කාර්මික වැඩමුළුවක් පවත්වනු ලැබූ අතර උපකරණ ලැයිස්තුව තෝරා ගනු ලැබ ඇත.
- ප්‍රමිති පුහුණු, මූලාකෘතිකරණ සහ පරීක්ෂා පහසුකම් (SPTF) සඳහා පළමු උපකරණ කට්ටලය මිලදීගනු ලැබ සවි කරන ලදි.

- **ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය**

2016 අයවැය යෝජනාව හා අනුකූලත්වය දක්වමින් ,රටෙහි ඇති තාක්ෂණික අපනයනයන් ඉහළ නැංවීම සඳහා ජෛව තාක්ෂණ ක්ෂේත්‍රයේ මානව සම්පත වර්ධනය සඳහා දායකත්වය දක්වනු පිණිස ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානයක් ස්ථාපනය කිරීමේ කාර්යයෙහි අමාත්‍යාංශය නියැලී සිටී. යෝජිත නවෝත්පාදන උද්‍යානය ස්ථාපනය සඳහා අවශ්‍ය කෙරෙන භූමිය, නාගරික සංවර්ධන අධිකාරිය විසින්

දැනටමත් වෙන්කර ඇත. පිටිපන, අරමවත්ත ප්‍රදේශයේ ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය ස්ථාපනය සඳහා වෙන් කර දෙන ලද අක්කර 13.36ක් වූ භූමි භාගයෙන් නීත්‍යානුකූල හිමිකාරීත්වය නාගරික සංවර්ධන අධිකාරිය විසින් උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය වෙත පවරා දෙනු ඇත. ජාන විද්‍යාත්මක, ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ ජාත්‍යාන්තර මධ්‍යස්ථානයේ, (ICGEB) දකුණු ආසියානු කලාපය සඳහා වන කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානය (RRC) බවට ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය (SLIBTEC) පත්වනු ඇත. රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතා සඳහා වන නියෝජිතායතනය විසින් ශක්‍යතා අධ්‍යනයක් සිදුකරනු ලැබ ඇත.

- **පොහොර වර්ග වැඩිදියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරු බිම්හි සාරවත්භාවය ඉහළ නැංවීම**

රසායනික පොහොර (NPK) භාවිතය 50% කින් අවමකරමින් වී අස්වනු 20 % කින් ඉහළ නංවන ක්ෂුද්‍ර ජීවී විද්‍යාත්මක ජෛව පොහොරක් වැඩිදියුණු කිරීමට ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) සමත්ව ඇත. 2091 වර්ෂයේදී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය යටතේ අක්කර 15,000 ක භූමි ප්‍රමාණයක මෙම ජෛව පොහොර භාවිතය අත්හදා බලනු ලැබ ඇත. 2020 වර්ෂයේදී මෙම භූමි ප්‍රමාණය අක්කර 50,000 දක්වා පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ.

≈ **දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදනය සඳහා දැව සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**

විද්‍යා, තක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI), මොරටුව විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා සහයෝගීතාවයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ දැව නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය (TDIC) සහ දැව පිරිසැකසුම් නවෝත්පාදන මධ්‍යස්ථානය (TPIC) ස්ථාපනය කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කෙරේ. මෙම මධ්‍යස්ථාන සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින්, ශ්‍රී ලාංකීය දැව හා දැව කර්මාන්තය වැඩිදියුණු කිරීමත්, උසස් තත්ත්වයේ ගෝලීය අපනයන වෙළඳපළ වෙත ශ්‍රී ලාංකීය දැව නිර්මාණ හඳුන්වා දීමත් සිදු කෙරෙනු ඇත. අනාගතයේදී, දැව ක්ෂේත්‍රය සඳහා සහාය ලබාදෙනු පිණිස අංගසම්පූර්ණ මධ්‍යස්ථානයන් ලෙස මේවා ක්‍රියාත්මක කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ අමාත්‍යාංශය යටතේ ඇති COSTI ආයතනය අතර ත්‍රිපාර්ශවීය අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් තබන ලදී.

ක්‍රියාකාරී සැලැස්ම යටතේ හඳුනාගනු ලැබූ අදාළ ක්‍රියාකාරකම් සිදු කරනු පිණිස, TPIC සහ TDIC සඳහා වෙන් කරනු ලැබූ මූල්‍යමය ප්‍රතිපාදන අදාළ විශ්ව විද්‍යාල වෙත ලබා දී ඇත. TPIC යටතේ දැව පිරික්සුම් නවෝත්පාදන පිළිබඳ පර්යේෂණ 4ක් සාර්ථකව සිදු කරනු ලබන අතර, සියලු මට්ටමෙහි දැව කාර්මාන්තකරුවන් සඳහා අන්තර්ජාලය හරහා සම්බන්ධ විය හැකි වේදිකාවක් හඳුන්වා දීමට ඔවුන් සූදානමින් සිටී.

- **2019 අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ තොරතුරු**

අනු අංකය	සංදේශ අංකය	වර්තමාන තත්වය (අමාත්‍ය මණ්ඩල තීරණ)	
		මාතෘකාව	ලැබුණු දිනය
1	PS/NC/2/CP/40/2019	යෝජිත යාන්ත්‍ර විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මුලාරම්භය (MEDI) ස්ථාපිත කිරීම	2019.03.27
2	PS/NC/2/CP/46/2019	ශ්‍රී ලංකාවේ අති දුෂ්කර ප්‍රදේශවල ජනතාවගේ ගමනාගමන පහසුව සඳහා දැනට භාවිතා වන අනාරක්ෂිත වැල් පාලම් වෙනුවට නර්ඩ් (NERD) කුඩා පාලම් හඳුන්වා දීම	2019.03.27
3	PS/NC/2/CP/47/2019	ගීත හෝ සංගීතමය නිර්මාණවල හිමිකරුවන්ට කර්තෘභාග ගෙවීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරගැනීම සඳහා සහ සාමූහික සංගම් බලගැන්වීම සඳහා වන නියෝග	2019.03.27
4	PS/NC/2/CP/49/2019	ජාතික විද්‍යා පදනමේ 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	2019.04.03

5	PS/NC/2/CP/50/2019	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	2019.04.03
6	PS/NC/2/CP/51/2019	ශිල්ප සේනා ප්‍රදර්ශනය - ශ්‍රී ලාංකීය තාක්ෂණික විප්ලවය	2019.03.27
7	PS/NC/2/CP/52/2019	ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස් ලෙස මහාචාර්ය ආර්.යූ. හල්වතුර මහතා, සහකාර කොමසාරිස්වරුන් ලෙස මහාචාර්ය එම්.ඩී. දයාල් ප්‍රේමකුමාර ද කොස්තා මහතා සහ යසස් චන්ද්‍ර ද සිල්වා මහතා පත් කිරීම	2019.04.03
8	PS/NC/2/CP/91/2019	ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	2019.07.09
9	PS/NC/2/CP/95/2019	තිසත් ඩී.බී. විජේගුණවර්ධන මහතා අමාත්‍ය උපදේශක තනතුරට පත් කිරීම	2019.06.05
10	PS/NC/2/CP/96/2019	නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	නැත
11	PS/NC/2/CP/97/2019	ජාතික පර්යේෂණ සභාවේ 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	2019.10.10
12	PS/NC/2/CP/100/2019	ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	2019.07.09
13	PS/NC/2/CP/123/2019	මූලික පර්යේෂණ පිළිබඳ රුසියානු පදනම සහ ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම අතර විද්‍යාත්මක සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම	2019.07.24
14	PS/NC/2/CP/127/2019	බ්‍රසීලයේ සාවෝ පාවුලෝ පර්යේෂණ පදනම සහ ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනම අතර පර්යේෂණ සහයෝගීතා ගිවිසුම	2019.07.24
15	PS/NC/2/CP/191/2019 (CN)	ශිල්ප සේනා ප්‍රදර්ශනය - ශ්‍රී ලංකා තාක්ෂණික විප්ලවය (සටහන)	2019.10.10
16	PS/NC/2/CP/130/2019	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ හිටපු ප්‍රධාන ගණකාධිකාරීවරයකුව සිට විශ්‍රාම ලත් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියකු වන ඒ.කේ.පී. පීරිස් මහතා වසරක කාලයක් සඳහා තාවකාලිකව පත් කිරීම	2019.07.24
17	PS/NC/2/CP/134/2019	ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ඉංජිනේරුවරුන් සඳහා රුපියල් 15,000/- විශේෂ දීමනාව ලබාදීම	ලැබී ඇත
18	PS/NC/2/CP/135/2019	විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයෙහි (COSTI) අධ්‍යක්ෂ තනතුරෙහි සේවයේ නියුතු මහාචාර්ය අජිත් ද අල්විස් මහතාගේ වැටුප නිර්ණය කිරීම	2019.08.14
19	PS/NC/2/CP/137/2019	ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	නැත
20	PS/NC/2/CP/129/2019	ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	නැත
21	PS/NC/2/CP/150/2019	ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය යන නාමය ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ දෙපාර්තමේන්තුව ලෙස සංශෝධනය කිරීම	2019.08.27
22	PS/NC/2/CP/144/2019	ශ්‍රී ලංකා රජය සහ නේපාල රජය අතර විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයන්හි ඇතිකර ගනු ලබන අවබෝධතා ගිවිසුම	නැත

23	PS/NC/2/CP/146/2019	කාර්මික තාක්ෂණ ආයතනයේ 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	නැත
24	PS/NC/2/CP/182/2019	ජාතික විද්‍යා පදනමේ 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	නැත
25	PS/NC/2/CP/265/2019	ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	නැත
26	PS/NC/2/CP/275/2019	අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව	නැත
27	PS/NC/2/CP/251/2019	ජාතික බුද්ධිමය දේපල කාර්යාලය (NIPO) සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) අතර ඇති කරගනු ලැබූ කොන්ත්‍රාත්තුව උල්ලංඝනය කිරීම	නැත
28	PS/NC/2/CP/253/2019	ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම/ මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම	නැත
29	PS/NC/2/CP/209/2019	කාර්මික තාක්ෂණ ආයතනයේ (ITI) මාලබේ පිහිටි නවීන පර්යේෂණ හා සංවර්ධන සංකීර්ණයෙහි (MRDC) ස්ථාපනය කෙරෙන චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ ජෛව තාක්ෂණ විද්‍යාගාරය	නැත
30	PS/NC/2/CP/203/2019	ශිල්ප සේනා ප්‍රදර්ශනය - ශ්‍රී ලංකා තාක්ෂණ විප්ලවය	ලැබී ඇත
31	PS/NC/2/CP/284/2019	හවුල් ව්‍යාපාරයක් ස්ථාපනය හරහා, ශ්‍රී ලංකා රජය වෙත උපදේශනසේවා, ධාරිතා ගොඩනැංවීම, සැලසුම් නිර්මාණය සහ අවදානම් විශ්ලේෂණය, උපකරණ සපයා දීම, ක්‍රියාකාරීත්වය සහතික කිරීම හා සවිකිරීම සහ විද්‍යාගාර පහසුකම් සමඟ ඉංජිනේරුමය, පාරිසරික සේවා සපයා ගැනීම සඳහා අනුමැතිය	නැත

2.3 අභ්‍යන්තර විගණන අංශය

ප්‍රගතිය

අභ්‍යන්තර විගණනය යනු ආයතනයක සමස්ත කාර්යක්ෂමතාවය සහතික කරනු පිණිස ආයතනික පද්ධති සහ පටිපාටියන් කලින් කලට සමාලෝචනයට ලක් කිරීමයි. මෙය දෝෂ සහගත, අකාර්යක්ෂම සහ වංචනික ක්‍රියාවන් ආවරණය කර ගැනීම සහ ඒවා නිරවද්‍ය කරගැනීම සඳහා භාවිතා කරන මෙවලමකි. මූලික වශයෙන් අභ්‍යන්තර විගණනයේ දී සිදුවනුයේ, ක්‍රියාකාරකම්හි / මෙහෙයුම්හි ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය, මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වාසනීයත්වය, නීතිරීති හා අනුකූලත්වය යනාදිය සහතික කරනු පිණිස පද්ධතියෙහි අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීමයි.

අභ්‍යන්තර විගණන අංශය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සංවර්ධන නිලධාරීන් තිදෙනෙකුගෙන් එක් කළමනාකරණ සහකාරවරයෙකුගෙන් සමන්විතය .

මෙම අංශයෙහි ප්‍රධාන වගකීම වනුයේ, අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ එහි ඵලදායීතාවට සනාථ කිරීම, සංඛ්‍යා ලේඛන සැසඳීම, විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් එවන ලැබූ විගණන වාර්තා සඳහා පිළිතුරු කෙටුම්පත් කිරීම සහ අමාත්‍යාංශය වෙත ලැබෙන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කිරීමයි.

මෙම අමාත්‍යාංශය යටතේ ආයතන 12ක් ක්‍රියාත්මක කෙරෙන අතර ඒ අතරින් ආයතන තුනක, එනම් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC), ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම (SLIC), සහ ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO), සඳහා ඔවුන්ගේම අභ්‍යන්තර විගණන අංශයක් නොමැත. එබැවින්, මෙම අංශය විසින්, එකී ආයතන ත්‍රිත්වය සඳහා විගණන කාර්යය සිදුකරනු ලබයි. 2019 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු තුනක් පවත්වා ඇත. සාමාන්‍ය විගණන විමසුම් 20ක් ලද

අතර 18ක් සඳහා පිළිතුරු සපයා ඇත. අභ්‍යන්තර විගණන විමසුම් 02ක් ඉන් එකක් සඳහා පිළිතුරු සපයා ඇත.

2.4 විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ලේකම් කාර්යාලයේ (COSTI) සංවර්ධන මූලාරම්භයන්

- සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසර ආර්ථික වර්ධනය උදෙසා පහසුකම් සපයාදීම අරමුණු කරගනිමින් කොරියානු නවනිපැයුම් ප්‍රවර්ධන සංගමය (KIPA) විසින් කොරියානු බුද්ධිමය දේපළ කාර්යාලය (KIPO) සමඟ සහයෝගීතාවයෙන් "උචිත තාක්ෂණය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරයි. ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කොරියානු රජයේ මූල්‍යමය සහ තාක්ෂණික සහායයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල උචිත තාක්ෂණයන් වැඩිදියුණු කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිතය. 2019 වර්ෂය සඳහා, COSTI විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා අතුරින් පහත, තාක්ෂණ අවශ්‍යතාවය ශ්‍රී ලංකාව සඳහා තෝරාගනු ලැබිණි. මෙම යෝජනාව වනුයේ,

  - ප්‍රජා ජල පවිත්‍රකරණ පද්ධති වැඩිදියුණු කිරීම -කාර්මික තාක්ෂණ ආයතනයේ (ITI) රතු මැටි පෙරීමේ තාක්ෂණය හා සංකලනයෙන් ප්‍රතිආශ්‍රැති /අධි පෙරණ 3ක් නිදන්ගත වකුගඩු රෝගය පවතින ප්‍රදේශයන්හි ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කොට ඇත.

- COSTI විසින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (SLBC) සහයෝගීතාවයෙන් සමාජය වෙත විද්‍යාව සන්නිවේදනය කිරීමේ අරමුණින් 'අනන්තය' නමින් ගුවන් විදුලි වැඩසටහනක් ආරම්භ කරන ලදී. සෑම සඳුදා සහ බදාදා දිනකම ප.ව .6.30 සිට 7.30 දක්වා City FM සේවයේ හර්ට්ස් 89.6 හෝ 89.8 සංඛ්‍යාතය ඔස්සේ මෙම වැඩසටහන ප්‍රචාරය කෙරේ.

  2019 වර්ෂය තුළදී, දෙසැම්බර් 31 දින දක්වා වැඩසටහන් 90ක් ප්‍රචාරය වී ඇති අතර බෝ නොවන රෝග, රුධිර බැංකුව, ආරක්ෂිත කෘෂිකර්මාන්තය, මැටි කර්මාන්තය, උඩවැඩියා වගාව, ඉන්ද්‍රිය බද්ධ කිරීම, විද්‍යා සාහිත්‍යය,ඇමසන් වන විනාශය ,වෘත්තීමය ආරක්ෂණය සහ සෞඛ්‍යය ,සිමෙන්ති නිෂ්පාදනය, රැකියාවේදී සුරක්ෂිතතාව තහවුරු කිරීම -ඉදිකිරීම් ක්ෂේත්‍රය, ජීවිතාරක්ෂක ආධාර, රසායනික ද්‍රව්‍යයන්හි කාර්යක්ෂම භාවිතය, ඩයනෝසරයන්, ස්වාභාවික ඩයි වර්ග, තත්ත්ව කව, බලශක්ති ආචාට, වීදුරු නිෂ්පාදනය, නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ නවනිපැයුම්කරුවන්, කිරිපිටි නිෂ්පාදන ක්‍රියාවලිය, වායු දූෂණය ඇතුළු විෂයයන් ගණනාවක් මේ හරහා ආවරණය කර ඇත .

- සිය ප්‍රධානතම සේවාව ලෙස, නවනිපැයුම්කරුවන් සඳහා සහාය ලබාදීම තාක්ෂණ නවෝපාදන සහායක මධ්‍යස්ථානය (TISC) සමඟ සහයෝගීතාවයෙන් COSTI ආයතනය විසින් සිදු කෙරේ. භාෂාමය ගැටලු සහිත පුද්ගලයන්ට පේටන්ට් බලපත්‍ර හා අදාළ තොරතුරු සොයාගනු පිණිස අවශ්‍ය සහාය ලබාදීම, දේශීය පේටන්ට් ක්‍රියාපටිපාටි පිළිබඳ දැනුවත් කිරීම, පේටන්ට් කෙටුම්පත්කරණය සහ අනෙකුත් පේටන්ට් හා අදාළ ලේඛන සැකසීම සඳහාත් අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබාදීම මෙහි අරමුණ වේ. 2019 ඔක්තෝම්බර් මස අවසානය වන විට විවිධ බුද්ධිමය දේපළ අවශ්‍යතා හා අදාළව නව නිපැයුම්කරුවන් 30 දෙනෙකු සඳහා පහසුකම් සාර්ථකව සපයාදීමට TISC හා COSTI ආයතනවලට හැකියාව ලැබිණි.

  ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ (WIPO) බුද්ධිමය දේපළ පරිසරයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ එක් අංගයක් ලෙස නවනිපැයුම්කරුවන් සඳහා තාක්ෂණ පැවරුම් සහ වාණිජකරණය පිළිබඳ නවනිපැයුම්කරුවන් සඳහා මාර්ගෝපදේශකත්වය ලබාදීම තාක්ෂණ පැවරුම් කාර්යාලයක් ලෙස TISC@ COSTI විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ අනුව, ලෝක බුද්ධිමය දේපළ සංවිධානය විසින් TISC හා COSTI ආයතන විසින් ඉදිරිපත් කරනු ලැබූ, දේශීය නවනිපැයුම්කරුවන්ගේ තාක්ෂණයන් 3ක් හඳුනාගනු ලැබූ අතර මාස 06ක කාලයක් මුළුල්ලේ ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ විශේෂඥ මඬුල්ලක් යටතේ මාර්ගෝපදේශකත්වය ලබාදීම සිදු කෙරේ.

- ජෛව පද්ධති ප්‍රතිතන ක්‍රියාවලිය සම්බන්ධීකරණය සහ ඒ සඳහා සහාය දැක්වීම සිදු කරන ලදී. එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) විසින් ඒ සඳහා පහසුකම් සපයා දෙනු ලැබූ අතර COSTI විසින් සම්බන්ධීකරණය කටයුතු සිදු කරන ලදී.

– අදාල විශේෂඥයින්ගේ කැපවීම මත ජෛව පද්ධති තාක්ෂණ ප්‍රතීතන අත්පොත සකස් කරනු ලැබූ අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙහි කළමනාකාරීත්වය සහ මෙහෙයුම් කමිටුව විසින් කෙටුම්පත් කරනු ලැබූ අත්පොත පිළිගන්නා ලදී.

– තාක්ෂණ පීඨයන්හි ජෛව පද්ධති තාක්ෂණ පාඨමාලා සම්බන්ධීකාරකවරුන් සඳහා පුහුණු වැඩසටහන් 2ක් පවත්වන ලදී.

COSTI විසින් පිළියෙළ කරනු ලැබූ මාර්ගෝපදේශ ග්‍රන්ථය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා උපදේශන රැස්වීමක් පවත්වන ලද අතර ඒ පිළිබඳ අවසන් නිගමනයකට එළඹීම සිදු කෙරිණි. විගණකවරුන් සඳහා වන පුහුණු වැඩසටහනේ පළමු අදියර 2019 දෙසැම්බර් මසදී පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහනේ අරමුණ වනුයේ ජෛව පද්ධති තාක්ෂණ ප්‍රතීතන උපාධි වැඩසටහන් සඳහා ඇගැයීම් මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීමයි. විශ්ව විද්‍යාල, ජාතික ජෛව තාක්ෂණ කාර්මික සංගමය (NBIA) සහ UNIDO සමඟ මෙම වැඩසටහන COSTI ආයතනය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

2.5 ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

2.5.1 විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන්

සාමාන්‍ය ජනතාව මෙන්ම පාසැල් ශිෂ්‍යයින් අතර විද්‍යාව ප්‍රදලිත කිරීම සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

වර්ෂය	ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
2019	1. ග්‍රහලෝකාගාර දර්ශන	482	180,602
	2. එළිමහන් වැඩසටහන්	15	2,260
	3. තාරකා විද්‍යා පාඨමාලා	2	175
	4. ස්වාභාවික සංසිද්ධි සූර්යග්‍රහණ (26-12-2019) මුලතිව් ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය	 1 1	 1150 896
	5. ප්‍රදර්ශන I. “ශිල්පසේනා” ප්‍රදර්ශනය II. “Enterprise Sri Lanka” – ගම්පෙරලිය වැඩසටහන “රට වෙනුවෙන් එකට සිටිමු” වැඩසටහන	ප්‍රදර්ශන කුටි	

2.6 ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)

2007 වර්ෂයේදී රාජ්‍ය -පෞද්ගලික සහයෝගීතාවයක් ලෙස ස්ථාපනය කරනු ලැබූ ස්ලින්ටෙක් ආයතනය, 2008 වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් ලෙස සිය මෙහෙයුම් ආරම්භ කළේය. නිනිති තාක්ෂණය සහ උසස් තාක්ෂණයන් භාවිතය හරහා දේශීය ඛනිජ සම්පත් සඳහා අගයන් එකතු කිරීමේ හැකියාව ලබා දීම සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ අපනයන අංශය සඳහා සහාය දැක්වීම යන නිශ්චිත අරමුණ මුල් කරගනිමින් මෙම ආයතනය ස්ථාපනය කරනු ලැබිණි.

ස්ලින්ටෙක් ආයතනයෙහි 50% ක කොටස් හිමිකාරිත්වයක් ජාතික විද්‍යා පදනම හරහා ශ්‍රී ලංකා රජය සතුවන අතර ඉතිරි 50% ක කොටස් හිමිකාරිත්වය පෞද්ගලික අංශයේ ආයතන 7ක් විසින් දරයි .එම ආයතන වනුයේ , බ්‍රැන්ඩික්ස් ,ඩයලොග් ,හේලීස් ,ලෝඩ්ස්ටාර්, මාස්, ලංකෙම් සහ එල්.ඕ.එල්.සී යන සමාගම්ය. රජය විසින් යටිතල පහසුකම් සඳහා මූල්‍යමය සහාය ලබාදීමේ වගකීම දරමින්, පෞද්ගලික අංශය සමඟ එක්ව මෙම සමාගමෙහි මෙහෙයුම් වියදම් සඳහා සහාය ලබාදෙනු පිණිස අවශ්‍ය ප්‍රාග්ධනයද ලබාදෙන ලදී. මෙයට අමතරව ,

පෞද්ගලික අංශය විසින් මෙම ආයතනයට නායකත්වය සහ යහපාලනය ලබාදෙයි .මෙම සමාගම පෞද්ගලික සමාගමක් ලෙස සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත.

මූල්‍යමය නොවන දායකත්වය /බලපෑම

- විද්‍යා උද්‍යානය තුළ සිය අතිනවීන ඖෂධවිද්‍යාත්මක පර්යේෂණ සහ නිෂ්පාදන මෙහෙයුම් ස්ථාපනය කර ගැනීමට, හේමාස් හෝල්ඩින්ස්හි කොටස්කරුවෙකු වන මොරිසන්ස් සමාගම (පෙර ජේ. එල්. මොරිසන්ස්) ආකර්ශනය කරගන්නා ලදී. 2020 දෙවැනි කාර්තුව වන විට ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත අතර 2020 වර්ෂයේ තෙවැනි කාර්තුව වන විට බලාගාරයෙහි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙරෙනු ඇත. 2020 වර්ෂයේදී ඖෂධ නිෂ්පාදනය ආරම්භ කෙරෙනු ඇති අතර සක්‍රිය ඖෂධ විද්‍යාත්මක ද්‍රව්‍ය (APIs) නිෂ්පාදනය කිරීම සඳහා ස්ලින්ටෙක් සමඟ ඒකාබද්ධ පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදු කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස ඖෂධ ආනයනය සඳහා වැයවන වියදම් අවම කර ගැනීමට, රටක් වශයෙන් අපට හැකියාව ලැබෙනු ඇත.
- ස්ලින්ටෙක් විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ගණනාවක් හරහා, රටෙහි පර්යේෂණ හු දර්ශනය වෙනස් කිරීම සඳහා සැලකිය යුතු අන්දමේ දායකත්වයක් ලබා දෙන ලදී.
- කුඩා හා මධ්‍ය පරිමාණ අංශය සමඟ කටයුතු කිරීම හරහා අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය සහ ඖෂධ නිෂ්පාදකයින්ගේ සංගමය සඳහා සහාය ලබා දීම.
- සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයන් සමඟ එක්ව කටයුතු කිරීම මෙම විවෘත පර්යේෂණ වැඩසටහන්වලදී ජාතික විද්‍යාගාරයක කාර්යභාර්ය ස්ලින්ටෙක් විසින් ඉටු කරනු ලැබේ.
- අර්ථාන්විත පර්යේෂණ සිදු කිරීම සඳහා උපකරණ පරිහරණය සඳහා විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශය ලබාදීම.
- ශ්‍රී ලංකාවේ වැඩිදියුණු කෙරෙන නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව වැඩසටහන් සඳහා සහාය ලබාදීම.

2.7 2019 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

ආයෝජන අංකය	මාතෘකාව	යෝජනාව	ක්‍රියාත්මක කිරීමේ ආයතනය	සමස්ත වෙන්කිරීම් (රු.මි.)	වියදම (රු.මි.)	ප්‍රගතිය
Para 126	“Science at work” challenge	පසු අස්වනු හානිය අවම කරමින් කොස්, වට්ටක්කා, කෙසෙල් සහ මාළු ඇසුරින් සෞඛ්‍යමත් ආහාර හඳුන්වා දීම හරහා ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම	ITI	10	3.0	අගය එක්කළ සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදන (6ක්) සඳහා නිෂ්පාදන සංවර්ධන කටයුතු සිදුකෙරෙමින් පවතී. රසායනික; වීදුරු අමුද්‍රව්‍ය සහ මධ්‍ය ප්‍රසම්පාදන කාර්යයන් සම්පූර්ණ කරනු ලැබ ඇත.
		වී හා සුළු බෝග අස්වනු සඳහා ගෝලීය මිනුම් දඬු නිර්මාණය	NIFS	5	0.8	ශ්‍රී ලංකාවේ වී අස්වනු අවම මට්ටමක පවතින්නේ මන්ද යන්න පිළිබඳ මූලික යාන්ත්‍රණය අවබෝධකර ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මේ යටතේ සීමාසහිත වීමට හේතුවන ප්‍රධාන අහිතකර සාධක පිළිබඳ අවබෝධයක් ලබාගනු පිණිස භෞතිකවේදීය සහ ජෛව රසායනික ශිල්ප ක්‍රම ඇසුරෙන් විශ්ලේෂණයක් සිදුකෙරෙනු ඇත.

						බතලගොඩ වී පර්යේෂණ ආයතනයෙන් ලබාගත් දේශීය සහල් ප්‍රභේද 20 ක බිත්තර වී ප්‍රරෝහණය සඳහා යොමු කොට ඇත. PGRC වෙතින් ලබාගත් තවත් සාම්ප්‍රදායික ප්‍රභේද 50 ක් වැඩි ඵලදාවක් ලැබෙන රූපානුදර්ශීය ප්‍රවේණිදර්ශීය වෙනස්කම් සිදු කිරීම සඳහා යොදාලනු ලැබ ඇත. අම්බලන්තොට සහ ලබුදූව ප්‍රදේශයෙන් ඉතිරි සහල් ප්‍රභේද 11හි මව් බීජ ලබා ගැනීම සඳහා සහ PGRC සතු ජාත්‍යන්තර වගා ප්‍රභේද ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කර ඇත. DNA ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන රසායනික ද්‍රව්‍ය බොහොමයක් දැනටමත් ලබා ගෙන ඇති අතර මෙම ව්‍යාපෘතියේ මූලික අදියර ලෙස වැඩි ඵලදාවක් සහතික කෙරෙන ප්‍රවේණිදර්ශ සැකසීම සඳහා, ප්‍රභේද 100කින් DNA ලබා ගැනෙනු ඇත. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන DNA සහ cDNA වර්ධනය සහ ප්‍රමාණනය සඳහා RT-PCR යන්ත්‍රයක් මිලදී ගැනීමේ කාර්යය ආරම්භ කරන ලදී.
		NERDC තාක්ෂණ උද්‍යානය තුළ වර්ග අඩි 1500ක විශාලත්වයෙන් යුත්, වාසය කළ හැකි පිරිවැය ඵලදායී නිවාස ඒකකයක් මහජනතාව සඳහා ප්‍රදර්ශක ආකෘතියක් ලෙස ඉදිකිරීම	NERDC	7	7.0	ව්‍යුහාත්මක ඉදිකිරීම් අවසන් කරනු ලැබ ඇත. ස්ලැබ් දැමීමේ බිම් මහල කොන්ක්‍රීට් කිරීමේ සහ බිම් මහලේ බිත්ති නැංවීමේ කටයුතු 50% අවසන් කරනු ලැබ ඇත. ඉහළ මාලයේ බිත්ති නැංවීමේ සහ වහළ තැනීමේ කටයුතු අවසන් කරනු ලැබ ඇත. 2020 පෙබරවාරි මස අවසානය වන විට සම්පූර්ණ කිරීමට නියමිතය.

ජයග්‍රහණ

- පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සඳහා යොදාගත් පුපුරණ ද්‍රව්‍ය හඳුනා ගැනීමේ විමර්ශන කටයුතු සඳහා, ආරක්ෂක අමාත්‍යාංශය වෙත සිය සහායය ස්ලින්ටෙක් විසින් ලබාදෙන ලදී. පුපුරණ ද්‍රව්‍ය පිළිබඳ සිදුකරනු ලැබූ අපගේ අභ්‍යන්තර පර්යේෂණයන්හි ප්‍රතිඵල මත පදනම්ව, පුපුරණ ද්‍රව්‍ය හඳුනා ගැනීම පිළිබඳ සියලු ආරක්ෂක නිලධාරීන් පුහුණු කිරීම ස්ලින්ටෙක් විසින් සිදු කරන ලදී. FBI හෝ වෙනත් විදේශීය ආරක්ෂක විශේෂඥයින් විසින් ලබා ගැනෙන විමර්ශන සේවාවන් වෙනුවෙන් වැය වන ඩොලර් මිලියන ගණනක ඉතිරියක් අත්කර දීමට ස්ලින්ටෙක් ආයතනයට මේ හරහා හැකියාව ලැබිණි.
- NIFS, ITI සහ SLINTEC ඒකරාශීත්වයෙන්, ශ්‍රී ලංකා මිනිරන් ඇසුරෙන් වාණිජමය ශාක්‍යතාවයන් සහිත නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇත. මේ හරහා ඉදිරි අනාගතයේදී සුවිශාල වෙළඳපොළ විභවතාවක් නිර්මාණය කෙරෙනු ඇත.
- කොස්, වට්ටක්කා, කෙසෙල් සහ මාළු පසු අස්වනු හානි අවම කරමින් ITI ආයතනය විසින් වෙළඳපළ සඳහා සෞඛ්‍යාරක්ෂිත අතුරු නිෂ්පාදන හඳුන්වා දී ඇත.
- රාවණා 1, ප්‍රථම ශ්‍රී ලාංකික නිනිති චන්ද්‍රිකාව සාර්ථකව දියත් කරනු ලැබ ඇත.

විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන අංශය හමුවේ ඇති අභියෝග

1. විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන අංශය සඳහා ප්‍රමාණවත් අයුරින් රාජ්‍ය අරමුදල් යෙදවීමක් සිදු නොවීම.

2. පර්යේෂණ හා සංවර්ධන අංශය සඳහා යෙදවූ පෞද්ගලික අංශයේ ආයෝජකයන්ගේ මදකම

3. පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය ඵලදායි ආකාරයටම නොවීම- මෙම ක්‍රියාවලිය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

4. පර්යේෂණ වාණිජකරණය පිලිබඳව පැන නැගී ඇති ගැටලු

5. රජයේ වැටුප් ප්‍රමාණයන්හි ප්‍රතිඵලයක් ලෙස පර්යේෂණ ආයතන තුල වෘත්තිකයින් රඳවා තබා ගැනීම පිලිබඳව පැන නැගී ඇති ගැටලු

6. විද්‍යාඥයන්ගේ සහ පර්යේෂකයන්ගේ බුද්ධිගලනය

7. කර්මාන්ත-විශ්ව විද්‍යාල - පර්යේෂණ ආයතන අතර ස්ථාපනය කර ගනු ලැබ ඇති සහයෝගීතාවයන් දුර්වල තත්වයේ පැවතීම.

8. උපාධිධරයන් සඳහා විද්‍යා හා තාක්ෂණ කර්මාන්ත (කුඩා පරිමාණ) ආරම්භ කරනු පිණිස ව්‍යාපාර කුටි/ව්‍යාපාර ආරම්භයන්/තාක්ෂණ උද්‍යාන ගොඩනැංවීමේ අවකාශ සපයාදීම- රැකියා සොයන්නන් යන තත්වයෙන් මුදවාගෙන රැකියා සපයන්නන් බවට පත්කිරීම සඳහා

9. ජාත්‍යන්තර සහයෝගීතාවන් අවම වීම - විදේශීය සහයෝගීතාවයන් ආරම්භ කිරීම සඳහා පුළුල් නිල සාකච්ඡාවන් ආරම්භ කිරීම
10. විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනයන්හී පර්යේෂණ සංස්කෘතිය අකාර්යක්ෂම වීම.
11. ගෝලීය වශයෙන් තරඟ වැදීම සඳහා අවශ්‍ය වන තරඟකාරී පර්යේෂණ ප්‍රතිඵලයන් ප්‍රමාණවත් නොවීම
12. එක් එක් ආයතන සඳහා ලැබී ඇති විධිනියෝග ද්විත්වකරණය සහ අතිච්ඡාදනය වන පරිදි ආයතන ගණනාවක් පැවතීම

අනාගත ඉලක්කයන්

- එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා පරීක්ෂණ සේවා සපයා දෙනු ලබන කුඩා විද්‍යාගාර පිහිටුවීම හරහා ග්‍රාමීය ප්‍රදේශයන්හි තාක්ෂණ අවශ්‍යතා සපුරාලනු පිණිස ආදර්ශ විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන 25ක් ස්ථාපනය කිරීම
- "ශ්‍රී ලාංකීය මිනිරන් අගය කළ උසස් තත්ත්වයේ ග්‍රැෆීන් බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය" හරහා 2025 වන විට ඇ. ඩො. බිලියන 1ක ආදායම් උත්පාදනය කිරීමට සමත් කර්මාන්තයක් බිහි කිරීම
- ශ්‍රී ලංකා රජය විසින් වාර්ෂිකව පොහොර සඳහා වැය කරන රු. බිලියන 1ක් වූ වියදම, 2022 වර්ෂයේ සිට 30%කින් පහත හෙළීම සඳහා "Smart Release Fertilizer" ව්‍යාපෘතිය හරහා කටයුතු කිරීම
- "සාගර පිරිසිදු කිරීමේ තාක්ෂණයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය" හරහා 2025 වන විට සාගර සහ ජල දූෂණය අවම කිරීම පිළිබඳ තාක්ෂණික අංශයේ නායකයෙකු බවට පත්වීම.
- "ශ්‍රී ලාංකීය ග්‍රැෆීන් ඇසුරෙන් ලොව ප්‍රථම මිනිරන් අම්ල බැටරිය වාණිජකරණය" ව්‍යාපෘතිය හරහා ඉන්දියාවේ සහ අනෙකුත් දකුණු ආසියානු හා ගිනිකොණ දිග ආසියානු රටවල වෙළඳපළ කොටස් හිමිකරගනිමින් 2022 වන විට බැටරි 500,000ක අලෙවි ඉලක්කය සපුරා ගැනීම.
- ශ්‍රී ලංකා මුහුණ දී ඇති ප්‍රධානතම කෘෂිකාර්මික ගැටළුවක් වන පොස්පරස් විෂ බව ගැටලුව 2025 වර්ෂය වන විට විසඳාලීම.
- ජෛව තාක්ෂණ ආයතනය සහ ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය ස්ථාපනය කිරීම.
- සූර්ය බලශක්ති ආශ්‍රිත තාක්ෂණයන් පිළිබඳ 2000කට ආසන්න තරුණ පිරිසකින් සැදී ජාත්‍යාන්තර මට්ටමේ ශ්‍රම බලකායක් පුහුණු කිරීම සම්පූර්ණ කිරීම.
- දැව පදනම් කරගත් නිෂ්පාදන සඳහා සැලසුම් නිර්මාණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.

- විද්‍යාත්මක නිෂ්පාදන ප්‍රවර්ධනය උදෙසා වෙබ් අඩවියක් හඳුන්වා දීමහරහා විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථානයන්හි තොරතුරු තාක්ෂණ යටිතලයන් ඉහළ නැංවීම.
- ජෛව පොහොර හෝ සුහුරු පොහොර යොදා ගැනීම හරහා යූරියා පොහොර භාවිතය අවම කිරීම.

....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම:

තනතුර:

දිනය: 15/06/2020

අනුර දිසානායක
ලේකම්
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

පරිච්ඡේදය **03 - 2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2019	තත්‍ය 2018	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
5,288,701,000	**ආදායම් නොවන ලැබීම්**		**1,839,748,223**	**2,809,263,812**	
5,268,701,000	භාණ්ඩාගාර අග්‍රිම		1,708,780,000	2,709,824,000	**ඒසීඒ-3**
-	තැන්පතු		71,598,914	34,897,008.00	**ඒසීඒ-4**
20,000,000	අත්තිකාරම් ගිණුම්		23,821,253	28,514,167.00	**ඒසීඒ-5/5(ඒ)/5(බී)**
-	වෙනත් ලැබීම්		35,548,055	36,028,637.00	

5,288,701,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,839,748,223**	**2,809,263,812**	
5,288,701,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,839,748,223**	**2,809,263,812**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		**-**	-	
500,250,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	496,649,960	102,331,151	
213,810,490	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	203,655,256	543,092,103	**ජීසීජ්-2(ii)**
1,150,760,510	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,137,360,342	1,066,277,819	
-	පොළී ගෙවීම්	**8**	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
1,864,821,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**1,837,665,558**	**1,711,701,073**	
	මූලධන වියදම්				
21,165,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	18,403,585	28,717,535	
1,408,675,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	804,948,449	1,683,180,186	
1,273,850,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	736,659,574	1,057,920,174	**ජීසීජ්-2(ii)**
100,000,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	55,000,000	
9,160,000	හැකියා වර්ධනය	**14**	6,770,425	2,152,519	
591,030,000	වෙනත් මූලධන වියදම්	**15**	366,061,804	405,832,120	
3,403,880,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**1,932,843,837**	**3,232,802,534**	
45,900,000	**ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)**		**19,862,106**	**36,254,606**	
	තැන්පතු ගෙවීම්		5,771,099	2,489,987	**ජීසීජ්-4**
45,900,000	**අත්තිකාරම් ගෙවීම්**		14,089,997	33,764,618	**ජීසීජ්-5/5(ඒ)/5(බී)**
	ආදායම් ගෙවීම්		1,010		
5,314,601,000	**මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)**		3,790,371,500	4,980,758,213	
(25,900,000)	**2019 දෙසැම්බර් 31 දිනට ශේෂය ඌ = (ඇ-උ)**		**(1,950,623,278)**	**(2,171,494,401)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2019.12.31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2019 රු.	2018 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,675,853,653	1,174,278,084
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	57,966,615	67,697,871
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	606,493	-
මුළු වත්කම්		**2,734,426,761**	**1,241,975,955**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
ශුද්ධ වත්කම්		(45,230,481)	30,268,591
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,675,853,653	1,174,278,084
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	103,197,096	37,429,280
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	606,493	-
මුළු වගකීම්		**2,734,426,761**	**1,241,975,955**

පිටු අංක 5 සිට 104 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 105 සිට 122 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

අනුර දිසානායක
ලේකම්
ස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

C. P. R. Bandara
Chief Accountant
Ministry of Higher Education, Technology
and Innovation
3rd Floor, "Sethsiripaya" Stage I
Battaramulla

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තතය	
	2019 රු.	**2018** රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	35,429,415	36,028,637
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		-
අග්‍රිම ලැබීම්	1,708,780,000	2,709,824,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,744,209,415**	**2,745,852,637**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	662,405,139	608,768,568
සහනාධාර සහ මාරුකිරීම්	6,415,548	710,156
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	13,652,742	70,396,242
නොපිය වූ උප අග්‍රිම ශේෂය	606,493.00	
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**683,079,922**	**679,874,966**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,061,129,493**	**2,065,977,671**

<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	118,640	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	20,185,008	20,326,775
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**20,303,648**	**20,326,775**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	1,136,985,501	2,089,650,530
ආදායමෙන් ගෙවීම්	1,010	
අත්තිකාරම් ගෙවීම්	10,274,446	29,060,937
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,147,260,957**	**2,118,711,467**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(1,126,957,309)**	**(2,098,384,691)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ) + (ඊ)	**(65,827,815)**	**(32,407,020)**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	71,598,914	34,897,008
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**71,598,914**	**34,897,008**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	5,771,099	2,489,988
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**5,771,099**	**2,489,988**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**65,827,815**	**32,407,020**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**0.00**	**0.00**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

4. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය (PP&E)

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යය සාධනය

අදාල නොවේ

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය

රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,831,250	1,864,821	1,837,666	99
ප්‍රාග්ධන	3,275,850	3,403,880	1,932,844	57

3.7 මු.රෙ. **208** ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පලාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

ශ්‍රී.අ.	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
1	ජනාධිපති කාර්යාලය	ශිල්පසේනා ප්‍රදර්ශනය	5,000	5,000	4,080	82
2	ජනාධිපති කාර්යාලය	දේශීය අල ප්‍රභේදයන් පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ හා ලංකාවේ වියලි කලාපයේ තිරසාර බෝග වගාවන් පිළිබඳ ප්‍රවේශය	8,351	8,351	6,826	82
3	ජනාධිපති කාර්යාලය	වසවිසෙන් තොර ගොවිතැන	225	225	63	28
4	ජනාධිපති කාර්යාලය	දුම්ගසා පළතුරු ඉදවීම පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ	652	652	630	97
5	ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම්	අභ්‍යාසලාභී උපාධිධාරීන් සඳහා දීමනා ගෙවීම	3,000	3,000	2,053	68
6	සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ	ජාතික ගුණාත්මක යටිතල පහසුකම් ක්‍රියාත්මක සැලැස්ම සඳහා	21,500	21,500	-	0
7	කර්මාන්ත හා වාණිජ කටයුතු	රොබෝ තාක්ෂණය සඳහා විශිෂ්ඨතා මධ්‍යස්ථානය	5,000	5,000	-	0

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	**31/12/2019** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31/12/2019** දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	224,300	224,300		100
9152	යන්ත්‍රෝපකරණ	උප කාර්යාල වල වාර්තා ලැබී අවසන්ව නැත	835,781		
9153	ඉඩම්	916,818	916,818		100
9154	අස්පර්ශ වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ		698,955		100
9180	බදු දෙන ලද වත්නම්				

3.9 විගණකාධිපති වාර්තාව**

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	ටීඊසී/ඒ/එම්එස්ටීආර්/2019/එෆ්එස්	ඔබේ අංකය / உமது இல. / Your No.	දිනය / திகதி / Date 2020 ජූනි 2 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව හා 154(6) වාර්තා යථා කාලයේ නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම්

මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.6.1	අමාත්‍යාංශය යටතේ පවතින විදාතා මධ්‍යස්ථාන 267 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහාද මිලදී ගැනීම් සිදුකරන අතර වර්ෂය තුළ මිලදී ගත් රු.33,001,339 ක දේපල, පිරියත හා උපකරණ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර පෙර වර්ෂවලට අයත් දේපල, පිරියත හා උපකරණද හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	විදාතා මධ්‍යස්ථාන 267 ට අදාළ දේපල, පිරියත හා උපකරණ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ අනාවරණය විය.

(i) මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ රු.2,675,853,653 ක් ලෙස දක්වා තිබූ අතර භාණ්ඩාගාරයේ සිගාස් වැඩසටහන යටතේ එම අගය රු.2,686,430,140 ක් වශයෙන් දක්වා තිබුණි.ඒ අනුව රු.10,576,487 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) වත්කම් විකිණීමෙන් රු. 1,186,487 ක ලාභයක් වූ අතර එය ගිණුම්වල පෙන්නුම් කර තිබුණද භාණ්ඩාගාරයේ සිගාස් වැඩසටහන යටතේ පෙන්නුම්කර නොතිබුණි.

(iii) අමාත්‍යාංශය යටතේ පවතින විදාතා මධ්‍යස්ථාන 267 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහාද මිලදී ගැනීම් සිදුකරන අතර වර්ෂය තුළ මිලදී ගත් රු.2,372,846.75 ක දේපල, පිරියත හා උපකරණ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර පෙර වර්ෂවලට අයත් දේපල, පිරියත හා උපකරණද හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(අ) **ආදායම් නොවන ලැබීම්**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ආදායම් නොවන ලැබීම් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **තැන්පතු**

වර්ෂ දෙකක් ඉක්මවූ එකතුව රු. 1,995,988ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

(අ) විගණනයට පහත සඳහන් නිරීක්ෂණ අනාවරණය විය.

ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 299,030 ක් වූ අතර එම හිඟ හිටි ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 2 ක් දක්වා කාල පරාසය සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.306,799 ක් වූ අතර එම හිඟ හිටි ණය ශේෂ වර්ෂ 2 ක සිට වර්ෂ 3 ක් දක්වා කාල පරාසය සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016 ජූනි 15 දින සේවය යෙදී සිටියදී මියගිය එම්.එම්.දිසානායක මියගෙන් අයවිය යුතු රු. 98,154 ක ණය ශේෂය අයකර ගැනීමට 2019 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවය හැරගිය නිලධාරීන් වෙත ලබාදී තිබුණු යතුරුපැදි

I. මැද දුම්බර විද්‍යා මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්‍ෂණ නිලධාරී කේ.ඒ.ආර්.ධර්මකීර්ති මහතා 2016 දෙසැම්බර් 09 දින සිට සේවයට වාර්තා කර නොතිබූ අතර ඒ මහතා වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි අංක WP-MQ-2613 දරණ යතුරුපැදියේ වටිනාකම රු. 144,920 ක් වූයෙන් එකී මුදල නැවත අයකර ගැනීමට හෝ යතුරුපැදිය නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

II. පාතදුම්බර විද්‍යා මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්‍ෂණ නිලධාරී බී.ඒ.ජී.අම්බලතැන්න මහතා 2016 නොවැම්බර් 15 දින සිට සේවයට වාර්තා කර නොතිබූ අතර ඒ මහතා වෙත නිකුත් කර තිබූ යතුරුපැදියේ ලියාපදිංචි අංකය පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබුණි. ඒ මහතා වෙත ලබා දී තිබූ යතුරුපැදියේ වටිනාකම රු. 144,920 ක් වූයෙන් එකී මුදල නැවත අයකරගැනීමට හෝ යතුරුපැදිය නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.7 වත්කම් කළමනාකරණය

(අ) මූල්‍ය ප්‍රකාශන දිනය වූ 2019 පෙබරවාරි 28 දිනට භාණ්ඩ සත්‍යාපනය (verification) කර නොතිබුණි.

(ආ) විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට නිකුත් කරන ලද ඉන්වෙන්ට්‍රි අයිතම් හා ස්ථාවර වත්කම් වන ලැප්ටොප්, වොෂින් මැෂින් හා ජංගම දුරකථන ඇතුළු අයිතම් 19 ක් විගණන දිනය වූ 2020 අප්‍රේල් 30 දින දක්වා භාර දීමට කටයුතු කර නොතිබුණි.

1.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

(අ) මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම මුද්දර හෝ බඩු භාරව සිටීම එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබූ ඇති නිලධාරීන් ද රජයේ ගිවිසුම් වලට අදාල වවුචර් සහතික කරන, චෙක්පත් අත්සන් කරන අයද ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැන්පතු තැබිය යුතු වුවත් එකී කටයුතු වලට සම්බන්ධ අමාත්‍යාංශයේ නිලධාරීන් ඇප තැන්පතු තබා නොතිබුණි.

1.9 පාඩු හා හානි

අමාත්‍යාංශයට අයත් අංක PG - 9796 දරණ වාහනයට හදිසි අනතුරක් හේතුවෙන් රු.800,000 ක අලාභයක් සිදුවී තිබූ අතර එම අලාභය පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි.

1.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛණය	මුදල් රෙගුලාසි 891 (1)	පවත්වා නොතිබුණි.
බැරකම් පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 214	යාවත්කාලීනකර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමණාකරණය

ඇස්තමේන්තු හා අයවැය පාලනය

මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක්දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන් නිලධාරියාගේ වගකීම වුවත් ඒ අනුව කටයුතු කර නොතිබු නිසා පහත සඳහන් පරිදි වැය විෂයයන්ට අධි ප්‍රතිපාදන සලසා තිබුණි.

(අ) පහත සඳහන් වැය විස්තරයන් 10 ක් සඳහා වෙන්කර තිබු මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

වැය විස්තරය	ප්‍රතිපාදනය කරන ලද මුදල (රු.)
52-01-01-2002/11	1,000,000
52-01-02-2002	500,000
52-01-02-02-2202	25,000,000
52-02-03-22-2103/11	12,500,000

52-02-03-23-2104/11	75,000,000
52-02-03-24-2507/11	40,000,000
52-02-03-26-2103/11	50,000,000
52-02-03-26-2507/11	15,000,000
52-02-03-05-2301/11	100,000,000
52-02-05-00-2002/11	1,000,000

3. **මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය**

ඉදිරිපත්කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එච්.එම්.යූ.එස්.ඒ.විජේකෝන්
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04 — කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශක	සත්‍ය ප්‍රතිඵලය, අපේක්ෂිත ප්‍රතිඵලයෙහි ප්‍රතිශතයක් ලෙස		
	100%-90%	**75%-89%**	**50%-74%**
පිරිනමනු ලැබූ පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව			√
ස්ථාපනය කර ගනු ලැබූ ඒකාබද්ධ පර්යේෂණ/පර්යේෂණ - කර්මාන්ත සහයෝගීත්වය			√
දේශීය/ජාත්‍යන්තර වශයෙන් ලබාගත් පේටන්ට් සංඛ්‍යාව			√
විද්‍යාව ප්‍රචලිත කිරීම හා අදාළව පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව		√	
ප්‍රකාශයට පත්කරනු ලැබූ ව්‍යවසායකත්වය මත පදනම් වූ පර්යේෂණ පත්‍රිකා		√	
දේශීය/ජාත්‍යන්තර වශයෙන් අත්සන් තබන ලද තාක්ෂණ පැවරුම් ගිවිසුම් සංඛ්‍යාව			√
දේශීය/ජාත්‍යන්තර වශයෙන් වාණිජකරණය කරනු ලැබූ පර්යේෂණ සංඛ්‍යාව			√
වාණිජකරණය සඳහා මූල්‍යමය සහායය ලබා දී ඇති නව නිපැයුම් සංඛ්‍යාව		√	
විද්‍යාව ප්‍රචලිත කිරීම හා අදාළව ප්‍රකාශයට පත් කරනු ලැබූ විද්‍යාත්මක ප්‍රකාශන සංඛ්‍යාව		√	
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත තාක්ෂණය පවරා දීමේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	√		
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත සිදු කළ තාක්ෂණ පැවරුම්	√		

වැඩසටහන් සංඛ්‍යාව			
වැඩිදියුණු කරනු ලැබ හඳුන්වා දුන් නව ප්‍රමිතීන් සංඛ්‍යාව	√		
බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම යටතේ සමෝධානික පේටන්ට් සංඛ්‍යාව	√		
සම්පාදනය කරන ලද විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන පිළිබඳ ප්‍රතිපත්ති වාර්තා සංඛ්‍යාව	√		
සමාලෝචනය කරන ලද විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පිළිබඳ ආයතන සංඛ්‍යාව			√
ප්‍රතීතනය කරනු ලැබූ විද්‍යාගාර සංඛ්‍යාව			√

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගනු ලැබූ අදාළ තිරසර සංවර්ධන අරමුණු

අරමුණ/ පරමාර්ථ	ඉලක්ක	අත්කර ගනු ලැබූ සාර්ථකත්වයෙහි දර්ශක	මේ දක්වා අත්කර ගනු ලැබූ සාර්ථකත්වයෙහි ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සවිමත් යටිතලයන් ගොඩ නැංවීම ,අංග සම්පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය, නවෝත්පාදනය පෝෂණය කිරීම	නවෝත්පාදන දිරිමත් කිරීම සහ මිලියන 1ක ජනගහනයක් සඳහා සිටින පර්යේෂණ හා සංවර්ධන අංශයේ සේවකයින් සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ වියදම් සැලකිය යුතු අන්දමින් ඉහල දැමීම හරහා 2030 වර්ෂය වනවිට, සංවර්ධනය වෙමින් පවතින රටවලට සුවිශේෂීව, සියලු රටවල්හි විද්‍යාත්මක පර්යේෂණ හා කාර්මික අංශයේ තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීම. 1. අප්‍රිකා රටවල්, ඌන සංවර්ධිත රටවල්,වෙනත් රටවල් මගින් සම්පූර්ණ වශයෙන් වටවී ඇති සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍ය සඳහා මූල්‍යමය, තාක්ෂණික සහ කාර්මික සහය ලබා දීම හරහා සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසර සහ සවිමත් යටිතල සංවර්ධනයන් සඳහා පහසුකම් සැපයීම. 2. කාර්මික විවිධාංගීකරණය සහ පාරිභෝගික භාණ්ඩ සඳහා අගයන් එක් කිරීම හරහා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් සහතික කරමින්, සංවර්ධනය වෙමින් පවතින රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය,පර්යේෂණ හා නවෝත්පාදන සඳහා සහය ලබා දීම.	දළ දේශීය නිෂ්පාදිත සමානුපාතිකව පර්යේෂණ හා සංවර්ධන වියදම මිලියන 2ක් ජනගහනයට සාපේක්ෂව පර්යේෂකයන්		√ √	

5.2 තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීමේදී මුහුණ දීමට සිදු වී ඇති අභියෝග

අභියෝගයන්

1 පසුගිය වසර කිහිපය තුළ විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ආයෝජනයන් සඳහා අඩු ප්‍රමුඛතාවයක් හිමිවීම
2. රාජ්‍ය ආයතන, නියාමකයින්, පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල, ව්‍යාපාර, උපදේශන සමාගම් සහ වෘත්තීමය / ව්‍යාපාර කණ්ඩායම්වලින් සැදුම්ලත් සක්‍රිය ජාලයක් නොපැවතීම
3. පර්යේෂණ සඳහා පවතින රාජ්‍ය අංශයේ ආධිපත්‍ය සහ පෞද්ගලික අංශයේ පර්යේෂණයන් ප්‍රමාණවත් නොවීම
4. නිපුණතා සහිත මානව සම්පත් ප්‍රමාණවත් නොවීම
5. නිෂ්පාදන අංශය සඳහා අවශ්‍ය තාක්ෂණයන් වැඩිදියුණු කිරීම පිණිස ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන්හි ඌනතාවය
6. පර්යේෂණ හා සංවර්ධන අංශය පිළිබඳ උනන්දුව සහ දැනුවත්වීමේ ඌනතාවය
7. මෙම අංශය සඳහා ප්‍රවේශ වීම හා ආයෝජනයන් සිදු කිරීමට පෞද්ගලික අංශය වෙත ලබා දෙන දිරිගැන්වීම ප්‍රමාණවත් නොවීම
8. මූලික දත්තයන්හි ඌනතාවය

ජයග්‍රහණ

1. විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත (STEM) විෂයයන්හි සංකලනයක් ඇතුළත් කර විෂයමාලා සංවර්ධනය කිරීම හරහා අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම, ගුරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීමය පුහුණු වැඩසටහන් පැවැත්වීම
2. සමාජය පදනම් කරගත් පර්යේෂණ සඳහා වැඩි අවධානයක් යොමු කිරීම

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 31.12.2019 දින වනවිට සේවක සංඛ්‍යා කළමනාකරණය

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	සේවක සංඛ්‍යා හිඟය/ අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	27	20	07
තෘතීය මට්ටම	29	05	24
ද්විතීයික මට්ටම	742	654	88
ප්‍රාථමික මට්ටම	235	226	09

- **ප්‍රාථමික කාණ්ඩය යටතේ විදාතා මුරකරු** – 74 *

***** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හා අනුකූලත්වය දක්වමින් බඳවා ගනු ලැබූ මුරකරුවන් (විදාතා) 80 දෙනෙකු සඳහා ස්ථිර පත්වීම් ලබා දී ඇති අතර මොවුන් අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව යටතට ඇතුළත් කර නොමැත. මෙම තනතුරු, එවැනි තනතුරක් දරණ පුද්ගලයාට පුද්ගලික වන ලෙස පවත්වා ගනු ලැබේ. 2019.12.31 වන විට පවතින සේවක සංඛ්‍යාව 74 කි.

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

නිලධාරි හිඟතාවය නිසා අඩු නිලධාරින් සංඛ්‍යාවක් අතර අංශයන්හි කාර්යයන් බෙදී යාම හේතුවෙන් සමස්ථ සංවිධානයෙහිම කාර්යය සාධනය සඳහා අහිතකර ලෙස බලපා ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහන	පුහුණුව ලැබූ කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව	වැඩසටහන් කාලසීමාව	මුළු ආයෝජනය		වැඩසටහන් ස්වභාවය (දේශීය/ විදේශීය)	ලබාගත් ප්‍රතිඵල/ දැනුම
			දේශීය	විදේශීය		
අවදානම මත පදනම්ව අභ්‍යන්තර විගණන සැලසුම්කරණය පිළිබඳ සම්මන්ත්‍රණය	3	2019.01.22	21,000.00		දේශීය	අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම වර්ධනයට සහ නිලධාරීන් ගේ රාජකාරී කටයුතුවල කාර්යක්ෂම තාවය සහ ඵලදායීතාව ය ඉහළ නැංවීමට ඉවහල්විණි.
අයකැමි කාර්යභාරය හා වගකීම්	1	2019.01.21	5,000.00		දේශීය	
කාර්යාලක්‍රම, ගොනු කළමණාකරණය, රාජකාරී ලිපි ලිවීම හා සාරාංශ සටහන් ලිවීම	සියලු කාර්යමණ්ඩල සාමාජිකයින්	2019.09.02	30,500.00		දේශීය	
රාජ්‍ය අංශයේ ව්‍යාපෘතීන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශක්‍යතාවයන් වැඩි දියුණු කිරීම	3	2019.09.25-27 2019.10.07-09 2019.11.18-20	free		දේශීය	
විනය පරිපාටි	සියලු කාර්යමණ්ඩල සාමාජිකයින්	2019.05.16	40,000.00		දේශීය	
රාජ්‍ය සේවක වැටුප් සකස්කිරීම	1	2019.06.24	3000.00		දේශීය	
දේපළ හා පිරියත හා සබැඳි ස්ථාවර වත්කම් නඩත්තුව	3	2019.09.11	15,000.00		දේශීය	
තොරතුරු පනත පිළිබඳ වැඩමුළුව	80	2019.10.09	35,575.00		දේශීය	
"Outward bound" පුහුණුව	සියලු කාර්යමණ්ඩල සාමාජිකයින්	2019.11.08-10	643,850.00		දේශීය	
අධ්‍යන චාරිකා	1	2019.11.18-22	60,339.97		විදේශීය	
විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පුහුණුව	1	2019.06.16-19 2019.09.16-29	264,600.00		විදේශීය	
පුහුණු වැඩමුළුව	1	2019.03.17-24	43,200.00		විදේශීය	
පරිවර්තන වැඩසටහන	1	2019.06.23-29	50,400.00		විදේශීය	
අධ්‍යන චාරිකා	1	2019.09.29 2019.10.05	50,400.00		විදේශීය	
හිමාල විද්‍යා කවුන්සිලය පිළිබඳ වැඩමුළුව	1	2019.12.05-06	28,800.00		විදේශීය	
විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පුහුණුව	1	2019.09.16-27	308,000.00		විදේශීය	
විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පුහුණු බීජෝෂණය	1	2019.11.10-23	192,643.94		විදේශීය	
පුහුණු වැඩමුළුව	1	2019.03.17-24	43,200.00		විදේශීය	
ජාත්‍යන්තර පුහුණුව	1	2019.10.23-25	113,712.59		විදේශීය	
පුහුණු වැඩමුළුව	1	2019.11.10-23	192,643.94		විදේශීය	
ඩිජිටල් ආර්ථිකය	1	2019.11.11-15	43,200.00		විදේශීය	

පරිච්ඡේදය 07— අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන තීරණ/ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම්			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලත්වය දක්වා ඇත		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලත්වය දක්වා ඇත		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.5	සියලුම මාසිත ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා නොමැත	පෙර තිබූ උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කර නොමැත	අළුත් රෙජිස්ටරයක් සකස් කිරීමට අවවාද දී ඇත
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූලත්වය දක්වා ඇත		

3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමතවන පරිදී බලතල පවරාදී තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව , රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරියන්ගේ පාලනය යටත්ව කටයුතු කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකිරි සැලැස්ම සකස් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන සිමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව , වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ජා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලත්වය දක්වා නොමැත	වර්ෂය තුළදී මාස 5ක කාලයක් සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතිණි	පුරප්පාඩුව මේ වන විට සම්පූර්ණ කර ඇත

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
	සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදුකිරීම	අනුකූලත්වය දක්වා ඇත		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරික්ෂා කිරීම	අනුකූලත්වය දක්වා නොමැත	වාහන කිහිපයක් නැවත පරික්ෂා කොට ඇත	2020 වසරෙහි වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරික්ෂා කිරිමට සැලසුම් කොට ඇත
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම	අදාළ නැත		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අණාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදී වියදම් දැරීම	අනුකූලත්වය දක්වා ඇත		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලත්වය දක්වා ඇත		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූලවීම	අනුකූලත්වය දක්වා ඇත		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලත්වය දක්වා නොමැත	හිඟ මුදල පියවන ලෙස අදාල පාර්ශ්වයන්/ පුද්ගලයන් වෙත දැනුම් දීම	හිඟ මුදල පියවන ලෙස අදාල පාර්ශ්වයන්/ පුද්ගලයන් වෙත නැවත දැනුම් දීම සහ එම හිඟ මුදල පියවීමට අපොහොසත් වේ නම් අදාළ චක්‍රෙල්ඛ හා නෛතික විධිවධාන හා අනුකූලව කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතුකර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලත්වය දක්වා නොමැත		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නැත		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නැත		
15.3	මු.රෙ 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නැත		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලත්වය දක්වා ඇත		

16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේක අංක	අනුකූලත්වය දක්වා ඇත		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාගන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලත්වය දක්වා නොමැත	අමාත්‍යාංශයේ මහජන සබඳතා අවම මට්ටමක පවතින හෙයින්ද මහජනතාව සමහ ඍජුව කටයුතු නොකරන හෙයින්ද පුරවැසි ප්‍රඥප්තියක් දැනට සකස් කර නොමැත.	පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීමේ මූලික කටයුතු දැනට සිදු කෙරේ
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලත්වය දක්වා නොමැත		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාගන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම්කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම	මේ දක්වා ලැබී නොමැත		

2019

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

වැය ශීර්ෂ අංකය : 052
செலவினத் தலைப்பின் இல.: 052
Expenditure Head No : 052

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය (කැබිනට් නොවන)
விஞ்ஞான, தொழினுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சு (அமைச்சரவை அந்தஸ்தற்ற)
Ministry of Science, Technology and Research (Non Cabinet)